Journal of Social Sciences, Volume 01, No. 01 (2014) ISSN 2362-0366

# 5. යටත් විජිත සමාජ සන්දර්භය තුළ කුලය හා පංතිය පිළිබඳව විමර්ශනයක්
## ( 19වන සියවසේ රචිත පද්‍ය කාව්‍යය ඇසුරින් කරන විමර්ශනයකි)

ආචර්ය ඔලගන්වත්තේ චන්ද්‍රසිරි හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය


### පූර්විකාව

මෙම ලිපිය මගින් විමසා විමර්ශනය කරනුයේ බ්‍රිතාන්‍ය පාලන සමයෙහි 19වන ශතර්ෂය තුළ කුලය සමාජ සංස්ථාවක් ලෙස ගොඩ නැගී ඇති ආකාරය හඳුනාගැනීම, පංතිය හා කුලය කවියන්ගේ අවධානයට යොමු වීම, නව සමාජ ක්‍රමය තුළ කුල පදනම තවදුරටත් ආරක්ෂා කර ගත හැකි ද යන්න විමසා බැලීම ය. මේ කරුණු මගින් කුල පදනම බිඳ වැටී පංතිය තත්කාල පරිච්ඡේදයෙහි දී ඉස්මතු වන ආකාරය පෙන්වා දීම සිදු කෙරේ. පංතිය යන්න විග්‍රහා කිරිමේ දී මාක්ස්වාදි න්‍යායාත්මක පදනමෙහි සිට විග්‍රහා කර නොමැති ය. මෙම විෂය කාරණය සමාජ විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයට අදාළ වුව ද සාහිත්‍යාත්මක දෘෂ්ටියෙන් මේ පිළිබඳව විමසා බැලිය ම සිදු කර ඇත. මේ පර්යේෂණාත්මක ලිපිය සඳහා ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලය පුස්තකාලය, ජාතික කෞතුකාගාර පුස්තකාලය, ජාතික ලේඛනාගාර දේපාර්තමේන්තුවේ ලිපි ලේඛන මෙන් ම මහා බ්‍රිතානයේ ජාතික පුස්තකාලයෙහි ඇති ප්‍රාථමික හා ද්වීතියික මූලාශ්‍රය භාවිත කරන ලදි.


### කුලය සමාජ සංස්ථාවක් ලෙස හඳුනාගැනීම

ලංකාවේ කුලය හා පංතිය පදනම් කරගනිමින් පර්යේෂණ කෘති විශාල ප්‍රමාණයක් ලියැවී නොමැති අතර ම ලියා ඇති කෘති ප්‍රමාණය ද දශක කිහිපයක සිට සමාජ වෙනස්වීම හා දේශපාලන අරගල පදනම් කරගනිමින් මෙම කෘති රචනා කොට ඇත. ඉන්දියානු සමාජයෙහි කුලය හා පංතිය පදනම් කරගනිමින් ලියැවී ඇති කෘති ප්‍රමාණය එකසිය පනහකට අධික වූවකි. ( බ්‍රිතාන්‍ය පුස්තකාලයේ දත්ත- 20.09.2010) සමාජ ආයතනයක් වශයෙන් කුල සංස්ථාව 19වන ශතවර්ෂයේ කවියන්ගේ අවධානයට යොමු වීම විශේෂ කොට සැලකිය හැකි වේ.

සෑම මානව කණ්ඩායමක් ම සංවිධානය වූවකි. පුද්ගලයන් තනි තනිව ජිවත්වීමට උත්සහා කළත් ඔවුනොවුන් එකිනෙකා සමාජ ඒකකයක් ලෙස බැදි පවති. ඥාතිත්වය , වයස, ලිංගය , වෛවාහක තත්ත්වය , සමාජගත ආගම් හා සමාජ රුචිකම් ද එකිනෙකට බැඳුණු ආයතන වේ. Encyclopaedia of the Social sciences, 1954 :141).

කුලය යන්න ද සමාජ ආයතනය ලෙස හැදින් විය හැකි ය. පිටි රිවර්ස් පෙන්වා දෙන පරිදි කුලය(Caste ) යන්නෙහි මූලය පෘතුග්‍රීසි මූලයකින් සැදුනක් බවයි. තවදුරටත් Caste යන පදයේ ආරම්භය පිළිබඳව අදහස් දක්වන ලූවිස් ඩුමෝන්ට් - ( Lowis Dumont) මෙසේ දක්වයි. මෙම Caste යන පදයේ ආරම්භය පෘතුගීසි හා ස්පාඤ්ඤ භාෂාවන්ගෙන් පැමිණී බව තහවුරු වේ. නමුත් මීට පෙර මෙය ලතින් භාෂාවේ Castus Chaste යන වචනවලින් හඳුන්වා තිබේ. එහි තේරුම පිරිසිදු යන්නයි. මෙම වචනය ම ස්පාඤ්ඤ ජාතිකයන් විසින් ජාතියක් වර්ගයක් හැඳින්වීමට ද භාවිත කරන ලදී. 15වන ශතවර්ෂයේ මැද භාගයේ දී පෘතුගීසින් ඉන්දියාව තුළ ජාතියක් තුළ සිටින තවත් ජන


Department of Social Sciences, Rajarata University of Sri Lanka

කොටසක් හැඳින්වීම සඳහා මෙම පදය භාවිත කරන ලදී. වර්තමානයේ ඉංග්‍රීසි භාෂාවේ Caste යන යෙදුම විශේෂයෙන් ප්‍රංශ අකුරුවලට සමානව 1800 වර්ෂයේ දී භාවිතයට පැමිණ තිබේ. ප්‍රංශ භාෂාවට මෙම වචනය පැමිණ තිබෙන්නේ 1740 දී පමණ වේ. මේ අනුව කුලය යන වචනය ඉතිහාසය තුළ අර්ථ තුනක් ඔස්සේ ගොඩනැගුණු බව පැහැදිලි වේ. එනම් ලතින් භාෂාවේ දී එය පිරිසිදු යන අදහසිනුත් ස්පාඤ්ඤ ජාතිකයන් ජාතියක් වර්ගයක් හැඳින්වීම සඳහාත් , ඉන්දියානුවන් එක් ජාතිකයක් හැඳින්වීම සඳහාත් සහ ඉන්දියානුවන් එක් ජාතියක් ඇතුළත සිටින ජන කොටසක් හැඳින්වීම සඳහාත් ආදි වශයෙන් අර්ථ කිහිපයකම යෙදෙන බව දත හැකි වේ. ( Lovis Dumont Homo Hierarchicus, 1970 : 39 – 40)

J.H. Hutton ට අනුව කුලය පද්ධතියක් වශයෙන් සමාජයේ සංවිධානය වී ඇති ආකාරය ද පැහැදිලි කරයි. ඉන්දියානු කුලයන් පිළිබඳව ඔහුගේ විග්‍රහයන්ට අනුව කුලය ධුරාවලියකට අනුව සකස් වී ඇති අතර ම බ්‍රාහ්මණයන් එහි ඉහළ ම සිටින පිරිස ලෙස පෙන්වා දෙයි. විවිධ අවස්ථාවන් හා විශේෂයෙන් ආහාර ලිංගිකත්වය හා චාරිත්‍රමය කටයුතුවල දී උසස් කුලයක අයෙකු පහත් කුලයක අයෙකු සමග ඍජුව හෝ වක්‍රව සම්බන්ධතාවක් පැවැත්වීමෙන් උසස් කුලයේ තැනැත්තා දූෂණය වීමට ඉඩ ඇති බවත් කුලය පොදුවේ සාම්ප්‍රදායික වෘත්තියක් සමග බැඳී පවතින්නක් බව සඳහන් කරයි. ( Hutton , 1963: . 46) . එහෙත් ඉන්දිය මානව විද්‍යාඥයකු වූ එස් . සී . ඩුබේ S.C Duble ට අනුව කුලය යනු ගැටළු සහගත සහ නොමග යවන සුළු වචනයක් බවත් සඳහන් කරයි. ( Rajendra Pandey, 1986: 17)

මෙම කාරණය තවදුරටත් විග්‍රහා කිරීමේ දී කුලය යන්න ඊ. ආර් ලීච් පෙන්වා දෙන්නේ සමාජ සංස්කෘතික ජීවිතය තුළ ක්‍රියාත්මක ප්‍රබල සංස්ථාවක් ලෙස ය. ( Leach , 1960: 01) පුරාතනයේ ඉන්දියානු සංක්‍රමණයන් සමග ම ලංකාවට කුල සංකල්පය පැමිණෙන ලදී. හින්දු සංකල්පයක් මත කුලය යන්න සකස් වුව ද ලංකාවේ දී බුදු දහම පදනම් කරගත් සමාජය තුළ කුලය භික්ෂූන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලද සංකල්පයක් සේ ක්‍රියාත්මක වු බව හඳුනා ගත හැකි වේ. ( Silva, 1993: 80)

දකුණු ආසියාතික භාෂාවන්හි කුලය යන්නට වාචික අර්ථය දනවන වචනයක් පැහැදිලි ලෙස දැක ගත නොහැකි නමුත් ලංකාවේ ජනයා අතර Caste යන්නට සමානාර්ථවත් දනවන පද අතර ජාතිය, වර්ගය සහ කුලය යන්න භාවිත වේ. කුලය යන්න ඉංග්‍රීසි වචනයට බෙහෙවින් ම සමීපකමක් දක්වයි. ( Dennis B . McGilvray, 11) ජාතිය යන්න පුද්ගලයාගේ උත්පත්තිය යන්න පිළිබඳව ද අදහස් දැක්වෙයි. නමුත් මෙහි දී ජාතිය යන්නෙන් අදහස් වනුයේ වංශය හෙවත් වාසගම වේ. කුලය යන්න සමාජයෙහි වෙනස් ලෙස ම කථා කළ හැකි මාතෘකාවකි.( Robert, 46) කුලය යනු පවුල් පද්ධතිය ආගම හා ආර්ථික අංශ යන සියල්ලෙන් ම බැඳුණු දැඩි විශේෂිත වු සමාජ සංවිධානයක් වේ. එමෙන් ම සමාජ ආයතනයක් ද වේ. ඉන්දියාවේ තරම් ඉතා තද අයුරින් ලංකාවේ කුල ක්‍රමය ක්‍රියාත්මක නොවීය. ( Ryam, 1993 , 25)

කුලය දකුණු ආසියාවේ අතීතයේ සිට පැවත එන මූලික සමාජ සංස්ථාවකි. සමාජ ස්තරායනය ක්‍රමයක් ලෙස කුලය සැලකීමේ දී හින්දු කුල ක්‍රමය සියලු කුල ක්‍රමයන්ගේ

මූල රූපය ලෙස සැලකේ. ( සිල්වා , 2005. 23 ) Binning ට අනුව ලංකාවේ මුල් වැසියන් කුලය පිළිබඳව හැඟීමකින් තොර වූවන් බවත් එය මෙරටට හඳුන්වා දී ඇත්තේ ක්‍රිස්තු වර්ෂයට සියවස් පහකට පමණ පෙර මෙරට ජයග්‍රහණය කළ ඉන්දියිනුවන් විසින් බව හෙතම පවසයි.( Binning, 46) ඉන්දියානු කුල ක්‍රමය හා ආගම අතර සමීප සම්බන්ධතාවක් තිබුණුමුත් බහුතරයක් බෞද්ධයන් වාසය කරන ශ්‍රී ලාංකික සමාජය තුළ කුලය සමාජ සමාජ සංස්ථාවක් ලෙස පැහැදිලිව පිළිගෙන නොතිබිණි. ( Anula, 1991:14) මෙයින් පැහැදිලි වන්නේ සිංහල සමාජ සංස්ථාවෙහි කුලය පුරාණ සංස්ථාවක් වුව ද ඉන්දියාවේ කුලවල තරම් දැඩිකම් හෝ භේද මේ කුල අතර දක ගත නොහැකියි. ( නන්දදේව1986: 75.)

එහෙත් කුල ක්‍රමය සමාජය තුළ තදින් ම ක්‍රියාත්මක වූ බව පෙනේ. ඩේවිට අනුව දිවයිනේ ඇති විවිධ ආයතන අතුරින් කුලය ප්‍රධාන ස්ථානයක් ලෙස හඳුනා ගනියි. එකිනෙකා විසින් අනුගමනය කළ යුතු වෙළඳ කටයුතු හා රැකියාව කළයුතු යුතුකම් නිර්මිත වූ සම්බන්ධතාවන් තීරණය කිරීම පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යෑම කුලය පදනම් කරගෙන සිදු බව ඩේවි පෙන්වා දෙයි. ( Davy , 87 )

යටත් විජිත කාල පරිච්ඡේදයේ දී විශේෂයෙන් පෘතුගීසින්ගේ මෙන්ම ලන්දේසීන්ගේ පාලනය යටතේ ද කතෝලික ආගම සහ රෙපරමාදු ආගම වැළඳගත් පහත් යැයි සම්මත කුලවල අයට කුල ක්‍රමය නොතකා විවිධ තනතුරු ගරු සම්මාන දීම දැක ගත හැකි වන අතර ම බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට නතු වන මොහොතෙහි මුහුදුබඩ ප්‍රදේශවල කුල ක්‍රමය බිඳ වැටෙමින් තිබුණ මුත් උඩරට රාජධානිය තුළ සම්ප්‍රදායානුකූල කුල ක්‍රමය දැඩි ලෙස ක්‍රියාත්මක වෙමින් පැවතිණි. ( ඇඳගම, 1991: 204.) ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ කුල ක්‍රමයෙහි ස්වභාවය වෙනස් වී ඇත. යටත් විජිතවාදීහු කුල ක්‍රමය අනුගමනය නොකළහ. එහෙත් ඔවුහු විවිධ පරිපාලන අවශ්‍යතා සඳහා කුලය යන්න භාවිත කළහ. (Silva, 2009 :02) මෙම විග්‍රහයන්ට අනුව 19වන ශතවර්ෂයෙහි කවීන් තමන් කාව්‍ය කෘතීන් සඳහා කුල ගෝත්‍රනාම භාවිත කිරීම හුදෙක් ප්‍රබල සමාජ සංස්ථාවක් වශයෙන් ක්‍රියාත්මක වීම නිසා යැයි සිතිය හැකි ය. කුලය හා බැඳුණු දෘෂ්ටිය කෙතරම් දුරට සමාජ විග්‍රහයේ දී පැවතියේ ද යන්න මෙහි දී විමසා බැලි ය හැකි ය.

**කුල සංකල්පය කවියට පාදක කර ගැනීම**

යම් රටක පුරාණයෙහි සිට පැවත එන සභ්‍යත්වය පිළිබඳ යම් අවබෝධයක් ඇති කර ගැනීමට වුවමනාවුවෙකුට හෝ ඒ සම්බන්ධ ව පරීක්ෂණ පවත්වන්නට අදහස් කරන කරන්නෙකුට හෝ පිටුවහලක් වන දැය අතර ඒ රටේ සාහිත්‍යය ද මුල් තැනක් ගනී. ලේඛකයන්ගේ පොත්පත් ආදියෙහි ඒ ඒ කාලවල ජීවත් අයගේ ජීවිතයන් පිළිබඳව ද පරිසරය පිළිබඳව ද සිතුම් පැතුම් හා හැගයිම් ආදි සියල්ලක්ම පිළිබඳව තොරතුරු ද ගැබ්වන බව කවුරුත් පිළිගන්නා කාරණයකි. මෙසේ සිද්ධ වීමට හේතුව නම් ලේඛකයකුගේ පරිසරය ඔහු කෙරෙහි තදින් බලපෑමයි. මේ නයින් සමාජයක් වෙනස් වෙමින් හැඩ ගැසී ආ හැටි දැන ගැනීමට පොත පත බෙහෙවින් ඉවහල් වන්නේ ය. ( ආරියපාල , 1962: හැඳින්වීම ) තත්කාලීන වාසය මිනිසාගේ චින්තනය ද හඳුනා ගත හැකි අතර ම ගෞරවයට පාත්‍ර වූ ප්‍රභූ ජනයාගේ ජීවිතය ද අනාවරණය කර ගත හැකි වේ. 19 වන සියවස ආරම්භයේ දී මුහුදුබඩ ප්‍රදේශවල සමාජයේ උසස් බලතල සහ සමාජ

තරාතිරමක් හිමි කර ගෙන සිටි මුදලිවරුන් ප්‍රධාන කොට ගත් මුහන්දිරම්, කෝරාල, ගම්මුලාදෑනි වැනි දේශීය ප්‍රධානීන් ප්‍රබල තත්ත්වයක පසු වූ අතර බදු අය කිරීමේ පටන් අධිකරණ කටයුතු තෙක් පුළුල් බලතල ඔවුන් සතු වූ බව පෙනී යයි. කුල ක්‍රමය යටතේ නිතර ම උසස් යැයි සම්මත කුලවල පිරිසට තනතුරු ලැබීම හේතු කොට ගෙන පොදු ජනතාවට බලපෑම් කිරීමට ද ශක්තියක් ඔවුන් සතු විය. ( Gooneratne, 1970: 116.) ලංකාවේ සමාජ ඉතිහාසය පිළිබඳව විමර්ශනය කළ විවිධ උගත්තු 19වන සියවස තුළ ක්‍රියාත්මක වු කුල වර්ග ගනනාවක් පිළිබඳ ව සඳහන් කරති. ලංකාවේ කුල ක්‍රමය පිළිබඳව විග්‍රහා කිරීමේ දී ඉන්දියානු කුල ක්‍රමයේ ආභාසය ඇතිව බිහි වූවක් ලෙස පෙන්වා දීමට ඇතමෙක් උත්සහාගෙන ඇති බව දැකිය හැකිය. එහෙත් කුල ක්‍රමය ක්‍රියාත්මක වීමේ දී ලංකාවේ ක්‍රමයට අවේණික ගොඩ නැගුණු බව ආනන්ද කුමාරස්වාමි පෙන්වා දෙයි. ( කුමාරස්වාමි, 1958 )

එහෙත් ලංකාවේ කුල ක්‍රමය 19වන ශතවර්ෂය වන විට වෘත්තිමය තත්ත්වය සමග ගොඩනැගුණක් බව ද පෙනේ. රාජකාරි ක්‍රමය මගින් දැඩි ලෙස කුල පදනම ක්‍රියාත්මක වීමක් සිදු වී ඇති බව පෙනේ. ( Silva, 1993,79) සිංහල කුල ධුරාවලිය පිළිබඳව පැරණිතම ලේඛනයක් ලෙස 13 වනශත වර්ෂයෙහි බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක විසින් ලියන ලද ජනවංශය හැදින්විය හැකිය. ජන වංශය ඒ ඒ කුලයන්ගේ අනුක්‍රමිකතාව පිළිබඳව විස්තර කරයි. ( ජනවංශය )

01 ගොවියෝ - වෙල්ලාලයෝ - හන්දුරුවෝ
02 කඹුරු - නවන්දන්නෝ
03 වඩුවෝ යකඩ වැඩ කරන්නෝ
04 හන්නලි - මහන්නෝ ගෙත්තම් කරන්නෝ
05 රදව් - රෙදි සෝදන්නෝ
06 ඇම්බැට්ටයෝ කරණවෑමියෝ
07 සොම්මාරයෝ හම්වැඩ කරන්නෝ පාවහන් සාදන්නෝ
08 දුරාවෝ - රා මදින්නෝ
09 කුම්භකාරයෝ - බඩහැලයෝ
10 කරාවෝ මාළු අල්ලන්නෝ
11 වැද්දෝ දඩයම් කරන්නෝ
12 බෙරවායෝ - නැකතියෝ
13 හකුරුවෝ - හකුරු සාදන්නෝ
15 හුන්නෝ හුණු සාදන්නෝ
16 පන්නයෝ - තණ කපන්නෝ
17 යමන්නයෝ - යකඩ උණු කරන්නෝ
18 ගහලයෝ - පහත් වැඩ කරන්නෝ
19 වැල් වඩුවෝ - වේවැල් වැඩ කරන්නෝ
20 පදුවෝ - දාස ගොවියෝ පල්ලැක්කි ගෙනියන්නෝ
21 මාලාකාරයෝ - උයන් පල්ලෝ
22 කින්නරයෝ - පැදුරු වියන්නෝ
23 රොඩියෝ - කඹ සාදන්නෝ යම් පදම් කරන්නෝ
24 බලියෝ - නටන්නෝ
25 ඉන්ද්‍රජාලිකයෝ - ඇස්බැන්දුම් කාරයෝ
26 චණ්ඩාලයෝ - ගෙරිමස් කන්නෝ කසල සෝදකයෝ

( කුමාරස්වාමි 1962 - 20-21)

ඉහත සඳහන් කුල ක්‍රමය 19 වන ශතවර්ෂයේ දී වෙනස් වූ බව ජෝන් ඩේවිගේ විසින් ඉදිරිපත් කළ විග්‍රහායෙන් දැක ගත හැකියි.

01 වෛශ්‍ය වංශය
  01 ගොවි වංශය
  02 නිලමක්කාර කුලය
02 ශුද්‍ර වංශය
  01 කරාව - ධීවර
  02 දූරාව - රා මැදීම
  03 ආචාරි - කම්මල්කාරයෝ
  04 හන්නාලි - ඇඳුම් මසන්නෝ
  05 බලහැලි - කුඹල්ලු
  06 ඇම්බැට්ටයෝ -පනික්කයෝ
  07 රදා - රෙදි අපුල්ලන
  08 හාලි - හලාගම
  09 හකුරු -
  10 හුණු - හුණු පුළුස්සන්නෝ
  11 පන්නයෝ - තණ කොළ කපන්නෝ
  12 විල්ලි දුරයි.
  13 දෙඩ වැද්දේ - දඩ වැද්දෝ
  14 පදු - යකඩ උණු කරන්නෝ
  15 බෙරවා
  16 නැදි - රාජකීය ගබඩාවට පෙට්ටි හා කුළු සපයන්නෝ
  17 පල්ලරු - ( සෝමරත්න 1967)

බ්‍රයස් රයම්ට අනුව 19වනශත වර්ෂය වන විට ගොවිගම, කරාව , සලාගම, දූරාව, නවනන්දන, හන්නාලි , හුණු, රොඩී, වහුම්පුර, බඩාල පනික්කි, පන්නදුරය, බෙරවා, බත්ගම, ඕලි ,පාලි ,කින්නර හා කවිකාර ආදි කුල ගෝත්‍ර ගනනාවක් පිළිබඳව දැක්වේ. ( Ryam , 1993: 94)

සිංහළ කුළ පුවත ( සිංහල කුළ පුවත 1886) නම් පද්‍ය කෘතියට අනුව කුල පරම්පරාව දැක්වීමේ දී විජය කුමාරයාගේ පටන් පැවත එන සියලු කුල පිළිබඳව සඳහන් කරයි. මෙහි දී කවියා විශේෂයෙන් ම උසස් හා පහත් යැයි සම්මත කුලයන්හි ස්වභාවය පෙන්වීමට උත්සහාගෙන ඇති බව පෙනේ. විජය කුමාරයා ලක්දිවට පැමිණ කල්හි අටලොස් ශ්‍රේණියක පිරිස පැමිණා බව ද දක්වන ලදී. එහිලා තත් කාල පරිච්ඡේදයෙහි පවා අඩු තක්සේරුවට ලක් වූ කුල ගැන ද සඳහන් වේ.

දහඅට සිල්පි දහසක් එවි කම්කරු වෝ
කොහොමට එව්වාද කව්දැයි එම කරු වෝ
එම එට යවානේ රන් රිදී ලෝකුරු වෝ
රජගෙට හෙලපලිස් කඩුදුනු අවිකරු වෝ
බඩහැල කුඹුරු රොඩී පදු බත්ගම ඉන් ද
අද බල පන්න ඔලි පලිඳුර ගහලුන් ද

සැමකල කසල ඇදකුනු වල ලන උන් ද
වැඩවල තැබී මදුරාපුර කලමෙන් ද

මේ යුගයේ කවියකුගේ කෘතියක් වන තරුණ තොටිල්ල නම් වූ පද්‍ය කාව්‍ය මගින් රජ, බමුණු, වෙළඳ, ගොයිගම, දුරාව, කරා, සලාගම, හන්නාලි, නවන්දන්න, වහුම්පුර, පනික්කි, හුනු ලද, පන්නවි, බඩහැල, ඔලී, කින්නර, ගහල රොඩී, වැදි ආදි කුල ගොත් විශාල සංඛ්‍යාවක් ගැන සඳහන් කරයි.

දෙයි අමවන් බසවත සඳ නිල්වර ල
වෙයිලැමරන් හසපැටි සිහිනිගල ක ල
කොයි ගමකින් ආමුත් විය සිතවික ල
ගොයිගම නන් නොහරිම් යතත් පණ න ල

සිරා ගණබ උවනත මන හරා සරා
සරා රණ තිසරවැනි පිය යුරා දරා
දරා සිතින් දෙන බස විලි හැරා දුරා
දුරාවේ නම් ගෙණ යම් කර නුරා සරා

බහුන්දර කරණ වත සඳ බිම්බාය
සිහුන්උර වෙනස නොව පිරි කුම්බා ය
මැහුන් කර සිටිය කත ඇඳ කම්බා ය
වහුම්පුර උනානම් මුව සිම්බාය

( විජේවීර1896: 8 , 9, )

කුලගෝත්‍ර විමර්ශනය ඉතිහාසය පුරාවට ද දැක ගත හැකිය. 16, 17 වන සියවස්වල දී කුලය යන්න තදින් ම සමාජය තුළ ක්‍රියාත්මක වු අයුරුක් දැක හැකිය . රොබට් නොක්ස් සඳහන් කරනුයේ සිංහලයන් අතර නානාප්‍රකාර කුල පවතින බවත් ඒවා භවබෝග සම්පත්තියෙන් හෝ රාජදත්ත තාන්න මාන්නවලින් හෝ ඇති වු කුල නොව ලේ පරපුරෙන් බෙදුණු කුල බවයි.එසේ ම කුලීනයෝ හා කුලහීනයෝ වශයෙන් බෙදා දක්වන අතර ම උසස් කුලවතුන් ඇඳුමෙන් නාමයෙන් ද සෙසු අයගෙන් වෙනස් වෙති. සාමාන්‍ය මිනිසුන් දණින් මදක් පහත් වනසේ එනම් කෙණ්ඩය අඩක් වැසෙන සේ වස්ත්‍ර හදිති. ස්ත්‍රීහු බොලට දක්වා වස්ත්‍රය හැඳ එයම කරකවා ළපැත්ත වැසෙන සේ පටක් කරේ ලා ගනිති. ( Knox, 1989. p. 199 ) මෙම අවදිය වන විට එය වෙනස් වී කාන්තාවන්ගේ වස්ත්‍රය කුල තත්ත්වය පෙන්නුම් කරන ප්‍රධාන සාධකයක් නොවී ඇති බව පෙනි යයි. ඇතැම් සමාජ විද්‍යාඥයන් කුල ධුරාවලිය පිළිබඳව සඳහන් කිරීමේ දී විවිධ කුල උසස් හා පහත් ලෙස බෙදා වෙන් කිරීමට උත්සහාගෙන ඇති බව පෙනේ. එහෙත් කුල ධුරාවලිය තුළ ඇතැම් පහත් යැයි සම්මත කුලයන්හි පිරිස් තම ඓතිහාසික උරුමයන් පිළිබඳව සඳහන් කරමින් තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ක්‍රියා කොට ඇති බව ද දැක ගතහැකියි. උක්ත සඳහන් පද්‍යකාව්‍යාවලියෙහි සඳහන් වන වහුම්පුර කුලය හා

සම්බන්ධයෙන් මේ තත්ත්වය දැක ගතහැකියි. බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඇති කරන ලද ඇතැම් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා ස්වකීය කුලයෙහි ඓතිහාසික උරුමයට නිසි තැන ලබා දෙන මෙන් කරන ලද ඉල්ලීම පිළිබඳව ද දැක ගත හැකි යි. ( Munasinha, 1928: 01) මෙම කාරණය තහවුරු කිරීම සඳහා විවිධ ඓතිහාසික සාහිත්‍ය ග්‍රන්ථයන්ගෙන් ද තොරතුරු ගෙනහැර දක්වා ඇති බව පෙනේ. පිරිස අධිකරණය ඉදිරියේ තම අයිතිය ඉල්ලා සිටි අවස්ථා ද දැක ගත හැකියි. මෙම තත්ත්වය ගොඩ නැගීම සඳහා ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ පහත් යැයි සම්මත කුලයන් සඳහා කිසියම් ආකාරයක සාමාජ පිළිගැනීම්හි අඩුවක් ඇති වීම යැයි ද සිතිය හැකි ය.

**උසස් හා පහත් යැයි සම්මත කුලය පිළිබඳව කාවියන්ගේ දෘෂ්ටිය**

18, 19 වන සියවස්හි යුරෝපයෙහි ඇති වූ කාර්මික විප්ලවය සමාජ වෙනසක් ඇති වීම සඳහා හේතු වී ඇත. මේ වෙනස යටත් විජිත රාජ්‍යයන්ට ද බලපාන්නට විය. මේ පසුබිම තුළ සාම්ප්‍රදායික මතවාද බිඳ වැටී නව ක්‍රමයක් ගොඩ නැගුණු අතර පංති අරගලයක් ද දැක ගතහැකියි.( Jayaraman, 1975: 2) මෙම ස්වභාවය මෙසේ පැවතිය ද 19වන ශතවර්ෂය වන විට ද ලංකා සමාජය තුළ කුලය සමාජයෙහි සක්‍රීය වී ඇති බව දැක ගත හැකි යි. තත්කාල පරිච්ඡේදයේ දී උසස් කුලය යනු කුමක් ද යන්න පිළිබඳ ප්‍රශ්න කාරිතත්ත්වයක පැවතිණි. බොහෝ කාව්‍ය රචකයෝ ගොවි කුලය හා කරා ව කුලය අතර පැවති තරගය ද තම කාව්‍යයන් සඳහා ගත්තහ. ගොවි කුලය යන්න ඉහළ කුලයක් ලෙස හුවා දැක්වීමට බොහෝ කාව්‍ය රචකයන් උත්සහාගෙන ඇති බව ද දැක ගත හැකි යි. කොළඹ හා තදාසන්න ප්‍රදේශයන්හි පොලිස් ඉන්ස්පැක්ටර් තනතුරක් දැරූ කොතලාවල ගැන ඇතැම් දෑ සඳහන් කරනුයේ ඔහුගේ තරාතිරම හා කුලගොත් ද සඳහන් කරමිනි. ජෝන් කොතලාවල ඉන්ස්පැක්ටර් මහතා පිළිබඳව සඳහන් කරනුයේ දැනට කොළඹ පොලිස් ඉන්ස්පැක්ටර් තනතුර දරමින් බොහෝ කාලයක් මෙම නගරය ඇතුළත නැවැත්විය නොහැකි ලෙස පැවැත්වාවූ දුසිරිත් දුරු කොට පොදු වැසියාට සැනසිල්ල ගෙනදුන් ජෝන් කොතලාවල ඉන්ස්පැක්ටර් මැතිතුමා -- (පෙරේරා 1893) යනුවෙන් කතුවරයා මෙය ආරම්භයේ දී ම සඳහන් කරයි.

ඒ ගැන සිත් සොම්නස් වී මහතෙක්
මේ මැතිදා ගැන කරමින් රෙක් මන්
මර්දානේ පොලීසියට යවා ලා
දීලා සර්ජන් මේජර් වැඩකුත්

මෙලකතුළ කොළොම්හී දුප්පතුන්දේ හොරාගත්
නෙක නෙක තැන උන්නාවූ හොරුන් බෝ වැනැස්සු
ගොවිකුලු මහතානන් තක්කඩියන්ගෙන් විජේලත්
දිනපති රැකදෙත්වා මේ මැතින්දාව දික්කල්
( පෙරේරා 1893 5 45)

මෙහි දී කවියා කොතලාවෙල මැතිඳුන් "ගොවිකුල" යනුවෙන් හැඳින්වීමෙන් පෙන්නුම් කරනුයේ තත්කාලීන සමාජයෙහි කුලය යන්න උසස් තත්ත්වයෙහි ලා සලකා ඇති බවය. ගොවිකුලය යන්න ගොවිගම යනුවෙන් ද හැඳින්වෙන අතර මෙයින් අදහස් න්නේ දහස් වනුයේ ගොවිතැන් කරන්නා ( Cultivator of the Soil ) නැතහොත් ගොවියා යන්න වේ.

එහෙත් ගොවිතැන ගොවි වංශයේ පිරිස්වල තනි අධිකාරියක් නොවීය. ගොවි වංශයට ම අදාළ වූ උපකුල කිහිපයක් ද දැක ගත හැකිය. රදල , මුදලි, පට්ටි , කටුපුල්ලේ , නිලමක්කාර, පොරොවකාර වහල් ගත්තර ගුරුවෝ යනාදි වශයෙනි. ( Ryam, 1993, 93 . 94 )

සිංහල සමාජයෙන් බහුතරයක් ම පිරිස ගොවිකුලයට අයත් වේ. ඔවුන්ගේ තරාතිරම් අනුව සමාජයෙහි උසස් තනතුරු ද පිරිනැමී ඇත. කොතලාවට පොලිසියේ ඉන්සපැක්ටර් තනතුරක් ලබා ගැනීමට ද ගොවි වංශය හේතුවිනැයි සිතිය හැකිය. ඇතැම් රචකයන් තමන් ගොවි වංශය හෝ වර්ණානවට පාත්‍රවන කතා නායකයා ගොවි වංශය යන්න සඳහන් කිරීමට කැමැත්තක් දක්වන අතර ම එය ඔවුන්ගේ අභිමානයට ද හේතුවකැයි සිතිය හැකිය. ඇතැම් විවේචකයන් ද ගොවි කුලය ඉතා උසස් කුලයක් ලෙස හැඳින්වීමට ද උත්සහාගෙන ඇත. ( Dharmarathna, 1890:1) 19 වන ශත වර්ෂයේ මුල් භාගයේ උසස් සැදැහැවතෙකු ලෙස මාතර වාසය කළ දාවිත් ද සරම් මුදලි විසින් මාතර නිල්වලා ගඟෙහි පවත්වන ලද ප්‍රථම ගංගාරෝහණ පිංකම පසුබිම් කොට රචිත සිලෝ කාව්‍යය ගංගාරෝහණ වර්ණනාව යි. ගංගාරෝහණ වර්ණනාව රචනා කළ කතුවරයා ස්වකීය කෘතිය අවසානයේ දී තම නම ගම ගෝත්‍රය ද සඳහන් කරයි.

සව් කව් නිවෙස් දනපදේ ගිරිපාද නම් යුත්
දා ගොයිකුලේ සමරසේකර නම් දිසානා
නම් ලෙව් පසන් කිවිතුමා ගුණයෙන් නැණින් යුත්
මේ ගත් සියේ එළු බසින් ගළපා මෙසේ කී

( ගංගාරෝහණ වර්ණාව ,1998 . 103)

කරාව හා ගොවි කුලය අතර තරගයක් පැවතිය ද කාව්‍ය රචකයන්ගේ වැඩි අවධානයට යොමු වී ඇත්තේ ගොවිකුල පිරිස බව පෙනේ. ඇතැම් කාව්‍ය රචකයන් තමන්ගේ කාව්‍ය රචනා ආරම්භයේ දී හෝ අවසානයේ දී තමා ගොවි කුලයට අයත් කෙනෙක් බව සඳහන් කිරීම තමන්ට අභිමානය ගෙනදුන් කරුණක් බව පෙනේ.

මන්නේ ගත්කුල දනෝ නෙක් රට දැනට බෝවා කාලයක සි ට
ගන්නේ නැත් මැයි පැවසු අව්පත් ඔවුන් හිමි විය උදළු තිර කො ට
දන්නේ නැතිව ද වැඩි කුලේ දනගස් මදින බව කිව්දු එ නිව ට
යන්නේ කුමට ද සතර පඩි දන ඔහොම අය හා වාද කෙරු ම ට

( සව්සත්දම් වාදය1948 : 132 )

" ජාතිවාදමර්දන වර්නනාව හෙවත් ජාතිවාද මර්දනයට උත්තර වශයෙන් ප්‍රසිද්ධ කර තිබෙන එළු බළු පොතට සහ ප්‍රහාරයටත් උත්තර" නම් පද්‍ය කෘතිය මගින් ද තත්කාලීන සමාජයෙහි කුලය පිළිබඳව පැවති සාම්ප්‍රදායික දෘෂ්ටිය ම දැක ගත හැකි යි.

ගොයිකුල මිස අනිත් එකක් ලකතුලදැන් නැති නිසා ම
ගොයිකුල අගපත් උනුබව එයින් හොඳයි හිතට ගැනු ම
ගොයි කුලයට උසස් එකක් ඇතොත් අනේ නොපමා ව ම
කොයි හැටිවත් කියාදෙන්ට තමුසේලාටමයි යුතුක ම

( ජාතිවාද මර්දන වර්නනාව , 1885.12)

තත්කාල පරිච්ඡේදයේ දී ජාති යන්න කුලය හැඳින්වීම සඳහා යොදා ගත්තකි. ගොවි වංශය හා කරාව කුලය අතර පැහැදිලි තරගයක් තිබූ බව දැක ගත හැකි යි. මේ සඳහා වෙන වෙන ම කෘතින් රචනා වී ඇති අතර ම භික්ෂූන්ගේ මැදිහත් වීම මත ජාති බේදය සාසනය සඳහා ඇතුළත් වී ඇති බව දැක ගත හැකි යි. මහණකමට සුදුස්සා ලෙස පෙන්වා දෙන්නේ ද ගොවි කුලයේ පිරිස ම වේ.

රජකුල බමුණු කු ල
ගොවිකුල සහ හීන කුල
අතුරෙන් මෙසිව් කු ල
මහණවීමට සුදුසු ගොවි කුල

අවුකුල ඇති ද නා
මෙබඳු සසුනෙහි සොබ නා
මහණව කිසිදි නා
රකිනු බැරි සිල් මනා ලෙසි නා
( ඉතිහාස මූලොච්ඡේදිනිය 1885 )

කුල බේදය යන්න භික්ෂු සංස්ථාවේ ද ඉතා තදින් ම ක්‍රියාත්මක වූ සංකල්පයක් බව පෙනේ. මෙහි දී "දුස්සීල වත" කෘතිය රචනා කළ කතුවරයා සමාජයෙහි පහත් යැයි සම්මත කුලයන්ගෙන් පැවිදි තත්ත්වයට පත් වූ භික්ෂූන් වහන්සේ ද නාමයන් කුලගොත් සමග පැවසීම නව සමාජ ක්‍රමය තුළ උසස් යැයි සම්මත කුලයන් තමන්ගේ කුල නාමය ආරක්ෂා කිරීම සඳහා දරන ප්‍රයත්නයක් ලෙස ද හැඳින ගත හැකි වේ.

හාලිකුලෙන් මහන කලේ පේසකාරණම් තෙරි දු
බඩල් කුලෙන් මහනකලේ ස්වරනකලේ කාරණම් තෙරි දු
වෙරල කුලෙන් මහනකලේ කුඹකාරණම් යති දු
රොඩි කුලෙන් මහන උනේ වඩාලය මහතෙරි දු
( දුස්සීලවත 1887. 36 )

එහෙත් මෙම වාදයන්ගේ පැහැදිලි නිගමනයන් දැක ගත හැකි නොවේ.

කුලය යනු සංස්කෘතියේ ප්‍රධාන දර්ශකයක් වේ. එමෙන් ම සමාජ ව්‍යුහයෙහි ප්‍රධාන ඒකකයක් වේ ( Leach, 1960:02) මිනිසාගේ භෞතික හා අභෞතික දෑ සංස්කෘතියට අයත් වන අතර ම සමාජ උරුමයෙහි කොටසක් ලෙස සංස්කෘතිය සැලකිය හැකිය. ( Adam Kuper and Jessi Kuper, 1996: 161) මිනිසා කුලය යන්න සලකා ඇත්තේ සමාජයෙහි පුද්ගලයන් වෙන් කරන ප්‍රධාන බලවේගයක් ලෙසට ය. මෙරට කුල ක්‍රමයේ ස්වභාවය ආගමික බලපෑමකට වඩා සමාජ දේශපාලන ස්වරූපයක් දිස් වේ. ධූරාවලිය සකස් කිරීමේ දී ක්‍රමයක් ලෙස මෙන් ම සමාජ පාලන උපක්‍රමයක් වශයෙන් ද කුලය පැවති බව 19 වන සියවසේ ඇතැම් රචකයන් සලකා ඇති බව පෙනේ. කුල ධූරාවලිය තුළ උස් පහත් භේදය වඩාත් හොඳින් කැපි පෙනෙයි. තත් කාල පරිච්ඡේදයෙහි ගොවිකුල කරාව හා සලාගම යන කුල ප්‍රධාන කුල ලෙස සලකා ඇති අතර ම බෙරවා කුලය කුල ධූරාවලියෙහි පහලොස්වන ස්ථානයෙහි ලා සලකා ඇත. ( Ryam, 1993:93.94)

බෙරවා කුලය යන්න ද කවි ඇසට යොමු වී ඇති බව පෙනේ. දොන් අන්දිරිස් කුරුකුලරත්නගේ ගන්ධර අදානියෙල් ප්‍රලාපකතුර හෙවත් සගබත් විදානයේ දී කවියා ස්වකීය කාව්‍ය කෘතිය ආරම්භ කරනුයේ ------ ----- ගිහි පැවිදි සිල්වත් ගුණවත් නිරාපරාධ නම්බුකාර බොහෝ දෙනාට කලක සිට අවනම්බු පැවසිවුපද පොත් ආදිය සාදා විකුණා ගැනීමෙන් ද පාන්ගස් පිළිම ආදිය සම්මාදන් කර ගනිමින් ජීවත්වන ගන්දර ගමේ සිටින මේ තැනැත්තා බොරුවට සගබත් වාදයක් පටන්ගෙන සවර්වඥ සාසනයට නින්දා කොට ප්‍රසිද්ධ කර තිබේ. -------- දූන්වීමයි යනුවෙනි.

<u>බලි ඇදුරෙකුට දාව ඉපදුන එකෙක් මේ ගන්දර සිටි න</u>
විලි නොමැතිව දහමේ කාරණාවලට කොයිබදෝ කුල බදාගෙන
බලි අරින විට කියන කයි උරුමයෙන් කයිපද බදී වන වන

( කුරුකුලරත්න, 1895: )

මෙහි දී කවියා බලි ඇදුරෙකුට දාව යන්න උත්ප්‍රාසයෙන් යුක්තව යොදා ඇති බව පෙනේ. නූර් යාල්මන්ට අනුව බද්දේගම ප්‍රදේශයෙහි කරන ලද පර්යේෂණයට අනුව විශාලතම පහත් කුලය ලෙස බෙරවා කුලය ( The Tom Tom Beaters) හඳුන්වා ඇත. එම ක්ෂේත්‍ර පර්යේෂණයේ දී පෙන්වා දී ඇත්තේ බෙරවා කුලය යන්න උසස් කුලවතුන් හඳුන්වා ඇත්තේ එක මිනිස්සු යනුවෙනි. පරම්පරාවෙන් පැවත එන නාමයන් ද ඔවුන්ගේ වාසගම් සඳහා භාවිත කරයි. ජාතක අටුවා ගැටපදයෙහි භේරිවාදක කුලය විස්තර කොට ඇත්තේ බෙර වැයු හා ගවමස් කෑමට පුරුදු වූ මිනිසුන්ගේ කුලයක් ලෙසය . ( ජාතක අටුවා ගැටපදය පි. 74 ) බෙරවා කුලය වූ කලී සංඛ්‍යාත්මක වශයෙන් වැඩියෙන් ම ආරක්ෂා වී ඇති කලාත්මක පාරම්පරික කුලයක් වේ. ඔවුහු පරම්පරාත්මක වශයෙන් නක්ෂත්‍රය රෙදි විවීම මෙන් ම යක් දෙස්සන් ( බලි ඇදුරන් ) ලෙසත් කටයුතු කරති.( Ryam, 1993:93 ,124 )

මෙම තත්ත්වය මත තත්කාලීන බොහෝ බටහිර ලේඛකයන් පවා පෙන්වා දී ඇත්තේ ලංකා සමාජයෙහි ප්‍රධාන සමාජ ආයතනයක් ලෙස කුලය ක්‍රියාත්මක වන බව ය. ( Attanayaka )

කුලය ඉපැරණි කාලයේ දී නියම කරන ලද වෙනස් කළ නොහැකි ඉරණමකැයි යන විශ්වාසය නිසා තමනට වඩා උසස් කුලිකයන්ට මෙහෙවර කිරීම තමන් වෙත පැවරී ඇති යුතුකමක් සේ හීන කුලිකයෝ නිහඬව ම පිළිගත්හ. ( පීරිස්, 2001: 185)
දෛනික ජීවිතයේ දී වැඩකටයුතුවල දී වැදගත් මිනිස්සු හෙවත් කුලීනයෝ හීනකුලවලට අයත් වූවන් ලවා පහත් මෙහෙකාර සේවා ඉටු කරවා ගත්හ. හන්නාලියෝ පනික්කියෝ ( ඇම්බැට්ටයෝ) බඩහැලියෝ ( කුඹල්ලු) හේනයෝ ( රදවු ඩෝබි) හකුරු ( වහුම්පුර හෙවත් කන්දේ දූරයෝ) බෙරවායෝ ( නැකතියෝ) හා කින්නරයෝ සියලු දෙනාම හීන කුලවලට හෙවත් අඩු කුලවට අයත් වූවෝ වූහ. ( පීරිස් 188) බ්‍රයස් රයන්ට අනුව කුල ධුරාවලියෙහි අටවන ස්ථානය රදාකුලයට හිමි වී ඇත. හේන හෙවත් රදා කුලය ඩෝබි යන නාමයෙන් ද ව්‍යවහාර කෙරේ. උසස් කුලවතුන්ගේ රෙදි සේදීම ප්‍රධාන ජීවන වෘත්තිය වු අතර ම ඇතැම් පිරිස් කෘෂිකාර්මාන්ත කටයුතුවල ද නිරතව සිටිති. උසස් කුලවතුන්ගේ මගුල් තුලා කටයුතුවල දී ද රදා කුලයට විශේෂ කාර්යයන් පැවරේ. ( Ryam, 115)

රදා ගෙදර දුවගන ගොස් මහ බොරුවක් කියමි න්
දෙයාකාර හොඳරස ඇති බොරු උපමා දෙසමි න්
බයන්කාර අසුබ ලෙඩක් අපේ අම්මට ඇවිදි න්

( අප්පුහාමි, 1893 , 16, 17, 19)

ජීවිතයේ අර්බුද අවස්ථා ( උපත වැඩි විය පැමිණීම විවහාය මරණය ) පිළිබඳව කටයුතුවල දී රජකයාගේ සහාය අනිවාර්යෙන් ම ලබාගත යුතු වූ බැවින් රජකයා කේවල් කිරීමේ හැකියාව සහිත තත්ත්වයක සිටීම හා නොයෙකුත් වරප්‍රසාද රාශියක් භුක්ති විදීම බෙහෙවින් දැක ගත හැකියි.[12] සමාජ වෙනස්වීම් හමුවෙහි ද කුලය තවමත් ස්ථාවර සමාජ සංස්ථාවක් වශයෙන් ගොඩ නැගෙන්නට උත්සහා ගන්නා අයුරු මෙහි දී දැක ගත හැකි වේ. සමාජ ක්‍රමය තුළ අඩු කුලය (Low Caste) හා වැඩි කුලය යන්න පැවසීමට ද කවීන් ඍජු ලෙස ම පෙළඹී ඇති බව පෙනේ.

වැඩිකුලේ ලඳ ටා
වඩා අඩුකුල ලිය ටා
සැප ලැබේ සොඳ ටා
කිව්ඳු මත සා වඩවා සතුටා

( කරුණාරත්න 1891 : 69 70 )

ගෙදරට ආවිට බත්කුව හෝ පැදුරක් දී එලමින් කෙසෙල් කොලේ
කොතලෙට දිය දී කඩදෙමින් වැඩ ගන්න සිරිත් දන හීනකු ලේ
මෙකලට එව්වේ එමවැජ ගැම්මට මයි පඩුවස් නිරිඳුන් එක ලේ
මෙකලට උඩ උතුම් නිල දී වැඳ පස්සට වෙතිදන උතුම් කු ලේ

( සිංහළ කුළ පුවත 1886 28)

අඩුකුලය යන්න විශේෂයෙන් ම සමාජයෙහි ඉතා ම තදින් ම ගිලා බැසගෙන තිබූ සංකල්පයක් බව දත හැකි වේ. කුලය යන්න සමාජ ගරුත්වය පිළිබිඹු කරන්නක් ලෙස ඇතැම්හු සැලකුහ. උසස් යැයි සම්මත කුලය පිළිබඳව සඳහන් කිරීමේ දී ඇතැම්හු තමා කිනම් රාජ වංශයකට සම්බන්ධ කොට පෙන්වීමට ද උත්සහා ගනිති. ( Stirrat. 1982 . 19)

මෙම නිගමනයන්ට වෙනස්ව යමින් කුලය යන්න වෙනත් මුහුණුවරකින් දකින්නට උත්සහා ගෙන ඇති ආකාරය ගැන මෙහි දී දැක ගත හැකියි. දේශපාලන ක්‍රමය තුළ ද අභ්‍යන්තරයෙහි තවමත් කුල ක්‍රමය ක්‍රියාත්මක පවතී. ( Gunasinghe, 1996. 158) තත් සමාජ ක්‍රමය තුළ පැවති කුල සංස්ථාව පිළිබඳව විදේශීය ජනයාගේ ආකල්පය මෙහි දී වැදගත් වේ. Valentia ට අනුව උසස් කුලයන් ස්වකීය වරප්‍රසාදයන් දැඩි සේ රකින පිරිසකි. ඔවුන් පහත් කුලයන්හි අයගේ අයිතිවාසිකම් බලයෙන් පැහැර ගෙන ඒ අයට දැඩි සේ රිදවනු ලැබේ. ඒ සඳහා ඔවුන්ට අයිතියක් ඇති බව ද ඔවුන් සිතන බව හෙතම පවසයි. ( Valentisa, 258) ක්‍රිස්තියානි මිෂනාරි කණ්ඩායම්හි මතය වී ඇත්තේ ද අඩු කුලයන්හි පිරිස් ක්‍රිස්තියානි ආගම් කෙරෙහි ඉක්මනින් හරවා ගත හැකි බව ඔවුන්ගේ විශ්වාසයක් ව පවතින බවකි. Binning ට අනුව ලංකාවේ මුල් කාලීන වැසියන් කුලය

[12] එම 189

පිළිබඳව සැලකිල්ලක් දක්වා නැති බව ( Binning, 46 ) පවසන අතර ම කුල ක්‍රමය හඳුන්වා දී ඇත්තේ ද ඉන්දියානුවන් විසින් බව ද ඔහුගේ මතය වේ. එහෙත් ඬේවි මීට වඩා වෙනස් මතයක් දරමින් දිවයිනේ ඇති ආයතන අතුරෙන් කුලය ප්‍රධාන ස්ථානයක් ගන්නා බව සඳහන් කරයි. කුලය විසින් එකිනෙකා අනුගමනය කළ යුතු වෙළඳ කටයුතු හා රැකියා තීන්දු කරන අතර ම එය පරම්පරාවෙන් පරාවට පැවතගෙන එන බව ද හෙතම සඳහන් කරයි. ( Davy, 87) මෙම විශ්ලේෂණයන්ට අනුව පැහැදිලි වන්නේ කාව්‍ය රචකයන් ද කුල පදනම පිළිබඳ සාම්ප්‍රදායික පිළිවෙත එලෙස ම පිළිගෙන ඇති අතර ම එය වෙනස් කිරීම සඳහා කිසියම් වෙහෙසක් ගෙන නොමැති බව ද දැක ගත හැකි යි. ස්වාධීන මතවාද ඉදිරිපත් නොකර තම තමන්ගේ කුල තත්ත්වයන් හුවා දැක්වීම සඳහා පමණක් ම මෙහි දී වෙහෙස වී ඇති බව පෙනේ.

**පංතිය විෂය වීම**

කුලය පංතිය හා සමාජ තත්ත්වය යන සංකල්ප සමාජ ස්ථරයෙහි බහුලව ම ක්‍රියාත්මක වන්නකි. ඇතැම් අවස්ථාවල දී මෙය උසස් හා පහත් ධනවත් හෝ දුප්පත් බලය ඇති හා නැති යනුවෙන් ද විග්‍රහා වන අස්ථා දැක ගත හැකි යි. ( Jayaraman, 1981, 08 ) සමාජ ස්තරායනයේ පැති දෙකක් ඇත. එකක් නම් ආදායම් මට්ටම් නිවාස තත්ත්වය දේපල හිමිකම් සහ සැප සම්පත් අතින් සමාජයේ විවිධ කොටස් අතර දැක ගතහැකි භෞතික විෂමතාව යි. මෙය සමාජයේ විෂය මූල අංශය ( Objectives) ලෙස සැලකේ. අනෙක නම් කිසියම් සමාජයක මිනිසුන් උස් පහත් බව මනින්නේ කුමන පදනමක් මත ද යන්න ය. මෙය සමාජ ස්තරායනයේ මනෝ මූල අංශය ( Subjective) සැලකේ. ( සිල්වා, 2005: 3 ) කුලය හා පන්තිය එකිනෙකට වෙනස් මූලධර්ම අනුව ක්‍රියාත්මක වන සමාජ ස්තරායන ක්‍රම දෙකක් ලෙස සැලකිය හැකිය. කුලය ජන්මය පවිත්‍රත්වය හා ලේ නෑකම වැනි මනෝ මූල සාධක මත පදනම් වී ඇත. අනෙක් අතට පංතිය ධනය බලය වරප්‍රසාද වැනි විෂයමූල සාධක අතින් ඇති අසමානාත්වය තුළින් බිහි වී ඇත. කෙනෙකුගේ කුල තත්ත්වය ජන්මයෙන් ම ( ආරෝපිතව) තීරණය වේ. කෙනෙකුගේ පන්තිය එක්කෝ ආරෝපිතව එනම් දෙමව්පියන්ගෙන් ලැබෙන දේපල යනාදිය මත නැතිනම් සාධිතව එනම් පුද්ගලයාගේ ඉගෙනීමේ මුදල් ඉපයීමේ හෝ බලය ලබා ගැනීමේ හැකියාව මත තීරණය වේ. ( සිල්වා 2005 17 ) මෙහි දී මනෝ මූල සිද්ධාන්තයට වඩා විෂය මූල පදනම යොදාගෙන විග්‍රහා කිරීමේ දී ඉංග්‍රීසි පාලකයන්ගේ ඇතැම් ක්‍රියා පිළිවෙත් මනෝ මූලික සිද්ධාන්තයන් අභිබවා විෂය මූලික කාරණා ඉස්මතු වන බව දැක ගත හැකි යි. පංතියෙන් ඉස්මතු වූ පිරිසට මෙන් ම ඉංග්‍රීසි පාලකයන්ගේ ක්‍රියාවන්ට අවනත වූ බොහෝ දෙනෙකුට කුල පදනමකින් තොරව විවිධ තාන්න මාන්න ආදිය ලැබීම නව සමාජ ක්‍රමයේ වෙනසක් වීමට ද හේතු වී ඇත (Dharmarathna, 1890:6)

සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයට විවිධ බලපෑම් ඇති වීමත් සමඟ ම වාණිජ වගාවන් සඳහා තිබූ බොහෝ බාධක ඉවත් කිරීම නිසා නව වාණිජවාදයක් 19 වන ශතවර්ෂය තුළ ගොඩ නැඟිණි. මෙමඟින් නව ප්‍රභූ පැලැන්තියක් බිහි විය. තදනන්තර ව ශ්‍රී ලංකා සමාජයෙහි සංස්කෘතික හා ආර්ථික වෙනස්කම් රාශියක් ඇති කිරීමට මෙම සාධකය ද හේතු විය . ( K.M silva, 1973: 263-264.) පූර්ව ධනවාදී සමාජයෙහි ඉඩම් හිමියන් ඉතා වැදගත් උසස් කුලවල (High caste People) පිරිස් වූ අතර පහත් කුලවල පිරිස් දුප්පත්කම උරුම කර ගත්තෝ වූහ. යටත් විජිත පාලකයෝ පවා මේ උසස් කුලවල පිරිස්වලට විවිධ තනතුරු නම්බුනාමාදිය ප්‍රදානය කළහ. මේ අනුව බලය, ඉඩම් හිමිකම සහ සමාජ

තත්ත්වය කුලය මත පදනම් විය. එහෙත් 19 වන ශතවර්ෂයේ සිදු වූ සමාජ ආර්ථික වෙනස්කම් නිසා කුල පදනමකින් තොර ව ධනය ඉපයීමේ අවස්ථාව බොහෝ පිරිස්වලට උදා විය. එහි ප්‍රතිඵලයක් ලෙස 19 වන ශතවර්ෂයේ දෙවන අර්ධයේ දී කුල පදනම බිඳ දමු ඉංගිරිසි උගත් බටහිරට නැඹුරු වූ මධ්‍යම පන්තියක් ලංකාවේ බිහි විය. මූලික සාම්ප්‍රදායික සමාජ සංවිධානය තුළ පැවති කුල ක්‍රමයට බ්‍රිතාන්‍ය රාජ්‍ය නිලධාරීන් මෙන් ම මිෂනාරීහු ද විරුද්ධ වූහ. ලංකාවේ කුල ක්‍රමය වෙනස් වීම කෙරෙහි බොහෝ කරුණු බල පා ඇත. ආර්ථික වෙනස් වීම, ගැහැණු හා පිරිමි යන දෙපාර්ශ්වය ම එක ම නේවාසිකාගාරවල එකට හිඳ ගෙන ආහාර ගැනීම ආදි අවශේෂ කාරණා ද හේතු විය. (Jayawardana,2000:164) බ්‍රිතාන්‍යයන් විසින් 1833 දී කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මගින් රාජකාරි ක්‍රමය අහෝසි කරන ලදි. එමගින් කුලය නිත්‍යානුකූලභාවයෙන් තොරවූ ආයතනයක් බවට පත් කරන ලදි. බ්‍රිතාන්‍ය පාලනය යටතේ විවෘත වූ ආර්ථික සමාජීයීය අවස්ථාවන් සිංහල හා දෙමළ සමාජවල ඉහළ කුලවල ජනයාට සීමා වූයේ නැත. කෙසේ නමුත් මුල් යුගයේ දී කුල ධූරාවලියේ ඉහළින් ම සිටි පිරිස් අලුතින් ම විවෘත වූ අවස්ථාවන්ගෙන් වැඩි වාසියක් ප්‍රයෝජන ලබා ගැනීමට උත්සුක වූහ. නව ආර්ථික රටාවත් සමඟ ම ඇති වූ නව ප්‍රවණතාවක් ලෙස දිස් වනුයේ මධ්‍යම පාංතිකයන්ගේ පවුල්වල එතෙක් ගෘහ කටයුතුවලට පමණක් සීමා වී සිටි ගෘහිණියන් ව්‍යාපාර කටයුතුවල නිරත වීම හා ඇතැම් වැන්දඹු ස්ත්‍රීන් පවුල්වල නායකත්වය ගෙන කටයුතු කිරීම ය. (Robert, 1997:219) නව ආර්ථික රටාව මගින් බිහි වූ මධ්‍යම පාංතිකයන් ගේ පිරිස අතිවිශාලය. කොන්ත්‍රාත්කරුවන් , කුඩා පරිමානයේ වෙළෙන්දන්, අරක්කු පෙරන්නන්, රේන්දකරුවන් හා බෝට්ටු අයිතිකරුවන් යන විවිධ රැකියා මගින් මුදල් උපයා ගත් පිරිසක් බිහි වු අතර ම කෝපි වගාව ආරම්භ වීමත් සමග ම මුදල් උපයාගැනීමේ හැකියාව තවදුරටත් වැඩි විය. එමෙන් ම පවුල් ඒකරාශි වි ආරක්කු වැනි ව්‍යාපාර පවත්වාගෙන යෑමෙන් ඒ එ පළාත්වල ප්‍රභූ තත්ත්වයක් නිරායාශයෙන් ම ගොඩ නැගිණි. (Jayawardana, 2000.52) විශේෂයෙන් කරාව කුලය පමණක් නොව තවත් බොහෝ කුලවල පිරිස හා ජාතීන් 19වන ශතවර්ෂයේ දී නව ආර්ථිකයෙන් ප්‍රයෝජන ගත්තහ. මේ නව ආර්ථික රටාවන් ගොඩ නැගීමෙහි ලා විශේෂයෙන් කෝල්බෲක් යෝජනා මගින් ඉදිරිපත් වූ රාජකාරි ක්‍රමය අහෝසි කිරීම යන්න ප්‍රබල ලෙස හේතු වී ඇත. දේශීය සමාජ හා අර්ථ ක්‍රමයේ වැදගත් අංශයක් වූයේ රාජකාරි ක්‍රමය යි. රාජකාරි ක්‍රමයට පදනම වූයේ රටේ සියලු ම ඉඩම් රජතුමාට අයත් ය යන පෙර පටන් පැවත එන සංකල්පය යි. මේ පදනම උඩ රාජ්‍යය තුළ ඉඩම් භුක්ති විඳින්නන් වසයෙන් රට වැසියන් ඒ සඳහා රජුට නැතහොත් රාජ්‍යයට කිරීමට බැඳී තිබුණු සේවය රාජකාරිය නමින් හැඳින්විණි. රාජකාරි ක්‍රමය පදනම් වී තිබුණේ ඉඩම් භුක්තිය හා කුල ක්‍රමය මත ය. (කරුණානන්ද, 1999 89) 1832 සිට රාජකාරි ක්‍රමය නැති කර දමන ලදි. මෙමගින් ඕනෑ ම පුද්ගලයකුට තමාට අභිමත රැකියාවක් තෝරා ගැනීමේ නිදහස උදා විය. නීතිය අභිමුඛයෙහි සෑම කුලයක ම ජනයා එක සමාන විය. මෙමඟින් වැඩවසම් ක්‍රමය බිඳ වැටී වර්තමානයේ නිදහස් සමාජය ගොඩ නැඟීම සිදු විය. (මොරගොඩ 1967෴ 09.)මෙම ක්‍රමය තුළ 19වන ශතවර්ෂයෙහි ජනයාගේ කෑම බීම ඇඳුම පැළඳුම භාෂාව මෙන් ම නිවාස ආදියෙහි ද වෙනස්කම් රාශියක් සිදු විය. බටහිර චින්තනයෙහි බලපෑම හේතුවෙන් දේශීය සංස්කෘතියට වෙනස් වූ තුන්වෙනි සංස්කෘතියක පිරිසක් බිහිවීම දැක ගත හැකි වේ.

යටත් විජිත ක්‍රමය තුළ ජීවත් වුණු පහත රැටියන් අතුරින් වඩා යහපත් ( පශ්චාත්) යටත් විජිත අනාගතයක් ගැන බලාපොරොත්තුවෙන් අධිරාජ්‍යවාදි ක්‍රමයේ බාධක අතරින් ඉදිරියට ගිය දේශීය ප්‍රභූ ( ධනපති) පන්තිය ඉස්මතු වීම සිදු විය. බ්‍රිතාන්‍යයන් විසින්

උඩරට රාජධානිය ග්‍රහණය කර ගැනීම පහත රටියන්ට වාසිදායක වූ අතර එම අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් ඇතැමුන් විසින් දේශිය උසස් පංතිය තුළ තමන් සඳහා තැනක් හිමි කර ගන්නා ලදි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් උසස් යැයි සම්මත ගොවිගම කුලයට අයත් නොවූ කරාව දුරාව හෝ සලාගම කුලවලට අයත් වූහ. 1880 ගනන් වන විට මෙම දේශීය ධනපතීන් ප්‍රධාන වශයෙන් ම බ්‍රිතාන්‍යයන් අත පැවති වැවිලි ආර්ථිකයට ඇතුළු වී සිටියා පමණක් නොව එහි සැලකිය කොටසක හිමිකාරිත්වය හද දැරිය. ( පෙරේරා 2004: 90 ) යුරෝපියන්ට යටත් වීම නිසා වානිජකරණය, මූල්‍යකරණය, බටහිරකරණය හා ක්‍රිස්තියානිකරණය හරහා පහත රටියන්ට වාසි සහගත තතත්ත්වයක් උදාවිය. වැවිලි ආර්ථික ක්‍රමයේ වෙනසක් සමගම පරිපාලන සේවයේ ඉහළම ස්ථරයන්හි සේවය කළ ලාංකේය පරිපාලන නිලධාරින්ට නව දේශිය ධනපති පන්තියට සංක්‍රමණය වීමට අවස්ථාව ලැබිණි. මෙය සිදු වුයේ අධ්‍යාපනය ඉංග්‍රීසි දැනුම ජීවන රටාව රැකියාව හා ඉඩකඩම් හිමිකම වැනි සාධක සාම්ප්‍රදායික පරිපාලන නිලධාරින්ගේ තත්ත්වයට වඩා උසස් බවට පත් වෙමින් තිබුණු සන්දර්භයක් තුළය ඉංග්‍රීසි අධ්‍යාපනය යන සාධකය මේ දේශීය ප්‍රභූ පන්තිය සමාජයේ අනෙක් කොටස්වලින් වෙන්කරන සාධකයක් විය. මේ අතර ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදි ආකෘති අනුකරණය කිරීම හරහා මොවුහු අධිරාජ්‍යවාදි ව්‍යුහ අවකාශ හා සංකේත තම ග්‍රහණයට ගනිමින් සිටි අතර ම තමන් යටත් වැසියන් වු සමස්ත අධිරාජ්‍යවාදි ක්‍රමයට ද අභියෝග කරමින් සිටියහ. මොවුන්ගේ සංස්කෘතිය සාමාන්‍ය ලාංකේය ජනයාට ස්වකීය බලය හා යටත් විජිත සමාජයට ස්වකීය වටිනාකම නිරූපණය කර දක්වන ආකාරයෙන් ගොඩනැගුණු අධිරාජ්‍යවාදි සංස්කෘතියෙන් තෝරාගත් අංගවල විශාල බලපෑමට ලක් වූ ඉහළ පන්තික සුපිරි ලාංකේය තුන්වන සංස්කෘතියකි.

බ්‍රිතාන්‍ය සංස්කෘතිය ආකෘතිය අනුගමනය කිරීමට සමගාමිව පහතරට සුපිරි පන්තිය සාම්ප්‍රදායික රදල බලයට හා උසස් යැයි සම්මත ගොවිගම කුලයට එරෙහිව තරග කරමින් සිටියහ. ( පෙරේරා 94) නව සුපිරි ධනපති පන්තිය බ්‍රිතාන්‍යයන් අනුගමනය කරමින් කොළඹ නගරයට පිවිසියා පමණක් නොව අධිරාජ්‍යවාදි ජීවන රටාව හා වාසස්ථාන ද අනුකරණය කළහ.

කොළඹ නගරය තුළ මේ ලාංකේය සුපිරි පන්තියෙහි පැවැත්ම ඉතා ප්‍රකටව පෙනෙන්නට තිබිණි. උසස් මාදිලියේ ගොඩනැගිලි තැනුණු අතර ඒවාහි නම් ආගන්තුක විය. නගරයේ භූමි දර්ශනය සාමාන්‍ය ලාංකිකයනට නුහුරු වූ අතර ම එය දේශීය හා විදේශීය ආර්ථික අංශ නියෝජනය කරන්නක් විය. එහි පරිසරය පූර්ණ වශයෙන් අධිරාජ්‍යවාදි නොවුණා මෙන් ම එහි වැසියෝ ද පූර්ණ වශයෙනි ලාංකිකයෝ නොවුහ. දේශිය සුපිරි පංතිය විසින් තනනු ලැබු වටපිටාව සාමාන්‍ය ලාංකේය සමාජයේ හා යටත් විජිත සමාජය අතර මැද ස්ථාන ගත වූ සම්මිශ්‍රිත අවස්ථාවකි. ( පෙරේරා 2004 100) මෙම විග්‍රහාය තුළ තත්කාලීන සමාජය කවියන්ගේ විෂය පථයට හසුවීම සාමාන්‍ය සිදුවීමක් සේ පෙනේ. මෙම ක්‍රමය තුළ කවියන්ගේ චින්තනයෙහි ද කිසියම් වෙනසක් සිදු වෙන බව මෙහි දී දැක ගන්නට පුලුවනි.

19වන සියවසේ රචිත යැයි සැලකෙන *දුම්රිය මාර්ග විස්තරය* නම් පද්‍ය කෘතිය මගින් කොළඹ සිට මාතර තෙක් දුම්රිය මාර්ගය විස්තර කරයි. මාතර සිට තරුණයකු කොළඹට පැමිණ සරණ පාවාගත් සිය මනාලිය දුම්රියෙන් මාතරට කැන්දාගෙන යන ගමනේ දී තරගයට කිවූ කවි ස්වරූපයන් මෙය රචනා කරන්නට උත්සාහ ගෙන ඇතත් එබන්දක්

මෙහි දැක ගත නොහැකි වේ. මාතර නිවැසි ජනයාගේ නිවාසවල ස්වභාවය[13] මෙන්ම දුම්රිය මාර්ගය දෙපස තත්කාලීන සමාජ තොරතුරු ද සඳහන් කරන්නට කවියා අමතක කර නැත.

ජනරාල් බාර්න්ස් ලකිසුරු තුමා ගරු
සුලකල් කැටයමින් කළ දිව නයුරු
පැහැදුල් මවුන්ට් ලෙවිනියා බන්ගලා ගරු
ඔය ගල්කිස්ස බැහැලා යමු විසිතුරු

( ඒ. ඩබ්. ජී 1895: 26 පද්‍යය )

මෙහි දී කවියා බංගලා යන ඉංග්‍රීසි තත්සම වචනය භාවිත කරයි. වතු ආර්ථික ක්‍රමය ගොඩ නැගීමත් සමග ම දේශීය හා විදේශීය ජනයාගේ භාවිතය සඳහා ප්‍රභූ නිවෙස් ඉදි කෙරිණි. කවියා ස්වකීය කෘතියෙහි දී ඇතැම් නාමයන් හඳුන්වනුයේ සිංහල නාමයෙන් නොව ඉංග්‍රීසි භාෂාවෙනි. "Second Division Maradana" යනුවෙනි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය එහි හිණිපෙත්තටම නැගි 1860 - 1880 ගණන්වලදි කොළඹ අධිරාජ්‍යවාදි සමාජය හා යටත්විජිත අධිකාරිය ඉතා සුවපහසු පැවැත්මක් හිමිකර ගන්නා ලදි

සගමිත් සතර සලනැති කොඩියක් පම නා
මගෙසිත් මහත් දුක්වැද දුටු කල සෙදි නා
යහපත් ජෝන් පෙරේරා කරවූ පහ නා
යුගනෙත් යොමා නරඹා සිරිසර නොමි නා[14]

( ඒ. ඩබ්. ජී 1895: 65 පද්‍යය )

එකම කුලය පිරිස අතර වුව ද දුප්පත් හා පොහොසත් යනුවෙන් බෙදීමක් විය. සාම්ප්‍රදායික සමාජය ක්‍රමයෙන් වෙනස්වීමත් සමග නිෂ්පාදිතයන්ට වැඩි වටිනාකමක් විය. මෙම ස්වභාවය කුල පදනම වෙනස්වීමක් සඳහා හේතු වූ බව පෙනේ. (Punalekar, 1981, 03) මෙම විග්‍රහයට අනුව සමාජ තත්ත්වය නිර්ණය කිරිමේ දී කුල පදනම වෙනස් වී භෞතික ජීවන තත්ත්වය වඩාත් ප්‍රබල සාධකයක් ලෙස ගොඩ නැගෙන බව දැක ගත හැකි යි.

දෙමට ගොඩ කාර් නෝනාගේ වටි නා
මිලට ගත් බක්කි රිය සුරුකිව තිබු නා
අනට බය නොමැති හොරු එය ගෙන ගොසි නා
දරට නැමුව සේ හොරණෙ ගම තිබූ නා

( පෙරේරා 1893. 11)

---

13. එම: 63 පද්‍යය

14 එම - 63 64 65 පද්‍යයන්

නොයෙක් පටසරොන් සමගව සිල්ක්මැරිණ කෝට් ඇඳ ලා
කුැර්ක් වැඩිපුර සැබඳ ගෙන දෙන සෙරෙප්පුත් පය ද ම ලා
කලක් කීවත් ඉවර නැතිමයි නොයෙක් විලසින් සැරසි ලා
පෙළක් තරුණෝ ඇවිත් රැල රැල නොයෙක් තුතිබස් දෙසා ලා

( හෙන්රි 1894 29)

හිරෙන් වැටිලා ආව අයමෙන් කොන්ඩා සමහරු කපාදම මි න්
මිලත් වටිනා නොයෙක් සළුපිළි නෙකලෙසින් ඇඳ පැලඳ ගනිමි න්
ඉසෙන් තොප්පිත් දමාලා විත් අලුත් ඉංග්‍රීසි දොඩවමි න්
තවත් සිටි තරුණෝ පෙළක් එහි විතර නැති බස් තෙපලමි න්

( ප්‍රේරා 22)

මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි 19වන ශතවර්ෂයෙහි බෞද්ධ පුනරුද ව්‍යාපාරයෙහි පුරෝගාමියෙකි. උන්වහන්සේගේ අපවත්වීමෙන් පසු ආදාහානය අවස්ථාවේ දී ඒ සඳහා සහභාගි වූ පිරිස මෙන් ම පානදුරා වාදය පැවැත්වූ මොහොතෙහි පැමිණ සිටි ජනයාගේ ස්වභාවය ද ඇතැම් කවීන්ට වස්තු විෂය වී ඇත. එහි දීද පෙන්නුම් කරනුයේ තත් කාලීන ජනයාගේ ජීවන තත්ත්වය ම වේ.

බනේ රත්රන් කඩුක්කන්ගෙන පැලඳ රතු නිල් මැනික් ඇල් ලි
සෙනේ ලෙස අල්ලල්ල කියමින් තරුණ පිරිමින් බලන කල් ලියෝ
ඉනේ එක රෙදිපට ඇඳ එකපටෙන් බඳ වසනා තිමල් ලියෝ
අනේ මේ වාදයකිමෙක්දැයි උනි පැත්තක මරක්ක කල් ලියෝ

( ප්‍රේරා 22)

ඇතැම් විචාරකයෝ සමාජ පංතිය විමසීමේ දී පුද්ගලයන්ගේ බාහිර සාධකයන් ද වහල් කොට ගනිති. මෙය කුල පදනමකින් තොරව දැකිය හැකි අතර ම අභිනව සමාජ විපර්යාශයන් සමග ඉස්මතු වූ නව සමාජ ක්‍රමය කියා පාන්නක් බව පෙනේ. පානදුරා වාදය ඇති වු අවස්ථාවේ දී එව නැරඹීම සඳහා පැමිණි සිටි ජනයාගේ ස්වභාවය ද මේ බව කියා පාන්නකි.

පසිඳු ඉංග්‍රීසි පිරිස මේ වාදය බලා යන පිනිස තිස්සෙ න්
සිනිඳු බඳ ඇති නෝනාවරුන් සහ ඇවිත් ඉඳගති තැනක තොස් සේ
දිලිඳු සෙනගට ඉන්ට ඉඩ නැති නිසා උනිපොහොසත් තු පස් සේ
නොමඳ ලෙස දුක් විඳ එදා වුණි උනුඋනුන්ගේ අසුන් අස් සෙ න්[15]

සාම්ප්‍රදායික කුල ක්‍රමය තුළ සිරවී සිටි ජනයා හට නව සමාජ වෙනස්වීම මගින් තමන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවාගෙන භෞතික ජීවන තත්ත්වය ඉහළ නංවාගෙන සිටීමට අවස්ථාවක් උදාවී ඇති බව දැක ගත හැකි යි.

**පංතිය තුළ ඉංග්‍රීසි භාෂාවේ පැවැත්ම**

බ්‍රිතාන්‍ය රජය තමන්ගේ යටත් විජිතයන්ගේ භාෂාව පිළිබඳව විශේෂ උනන්දුවක් දැක් වූහ. ඉංග්‍රීසි භාෂාව යටත් විජිත සමාජයන්හි හැකිතාක් ඉක්මනින් ව්‍යාප්ත කළ යුතු බව Alexander Duff ගේ නිර්දේශයෙන් දැක ගත හැකි යි. (Alexande, 1836. 25) දේශීය භාෂාවන් සමාජයෙහි ව්‍යාප්තිය එක් අතකින් අධිරාජ්‍යවාදී අරගලයක් ගොඩ නැගීම සඳහා හේතු විය හැකි බව ඔවුන් දැනගෙන සිටි බව පෙනේ. අධ්‍යාපනය ව්‍යාප්තිය කිරීම හුදෙක් යටත් විජිත වාදීන්ගේ දේශපාලන ව්‍යාපාරයෙහි ම කොටසක් ලෙස හඳුනා ගත හැකි වේ. ( රතනසාර 81) කෝල්බෲක් යෝජනා අතර විශේෂයෙන් මෙරට සමාජ සංස්කෘතික දේශපාලන වෙනස්කම් රාශියක් ඇති කිරීම සඳහා දැඩි බලපෑමක් ඇති කළ යෝජනාවක් ලෙස ඉංගිරිසි භාෂාව මෙරට පාලන භාෂාව බවට පත් කිරීම සඳහන් කළ හැකි ය. ( Mendis , 1956: 74) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙරාතු ව පන්සල කේන්ද්‍ර කොට ගත් ස්වාධීන අධ්‍යාපන මධ්‍යස්ථාන පැවතියත් එම තත්ත්වය හැකි තාක් ඉක්මනින් වෙනස් කිරීමේ අවශ්‍යතාව ඔවුනට දැනිණි. බ්‍රිතාන්‍ය පාලනයේ ආරම්භක කාල පරිච්ඡේදය තුළ පවා අධ්‍යාපනය ප්‍රධාන වාහකය වසයෙන් යොදා ගෙන ක්‍රිස්තු ධර්මය හා බටහිර සංස්කෘතිය මෙරට තුළ ස්ථාපනය කර ලීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක් ම යොදන ලදි. ( Birdwood 1967: 16) එසේ වුවත් ඉංග්‍රීසි භාෂාව ව්‍යාප්ත කරලීමේ පරමාර්ථයන් පුළුල් විෂය පරාශයක පැතිරී යන බව දැක ගත හැකි යි. සිරි හෙට්ටිගේ පෙන්වා දෙන පරිදි පහළ ස්ථරයන්හි ජනයාහට ඉහළ සමාජයට යෑම සඳහා පැවති ප්‍රමුඛතම මාර්ගය වන්නේ ඉංග්‍රීසි භාෂාව බව පෙන්වා දෙයි. ( Hettige , year: 21) පහළ පාන්තික මිනිසාගේ ස්වභාව වන්නේ නිරන්තරයෙන් ම ප්‍රභූ පැලැන්තියට යෑමට ඇති ආශාවයි. ප්‍රභූ පැලැන්තියේ බොහෝ ක්‍රියාකාරකම් කිරීමට ද පහළ සමාජ ස්ථරයෙහි ජීවත් වන ඇතැම් කෙනෙක් ප්‍රියතාවක් දක්වති. ( Wolfram, 1998. 188)

බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ඉංග්‍රීසි භාෂාව ව්‍යාප්ත කරලීම කෙරෙහි ද විශේෂ උනන්දුවක් දැක්විය. ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමෙන් අධ්‍යාපන, දේශපාලන හා පරිපාලන වසයෙන් ද විශාල වාසියක් අත් වන බව හෙතම කල්පනා කෙළේ ය. පිට පළාත්වල දක්ෂ සිසුන් කොළඹ ඇකඩමියට ගෙන්වා වැඩි දුර අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් ද හෙතෙම උත්සුක විය. ( රුබේරු1964: 129-130. )

බ්‍රිතාන්‍ය පරිපාලනයේ මුල් කාල පරිච්ඡේදය වන විට ශ්‍රී ලංකාව තුළ පාඨශාලා ක්‍රම තුනක් පැවති බව පෙනේ. රජයේ පාඨශාලා, මිෂනාරි පාඨශාලා සහ පෞද්ගලික පාඨශාලා වසයෙනි. ( රුබේරු1971: 27. ) මේ තත්ත්වය හමුවෙහි කෝල්බෲක් කොමිසම මගින් යෝජනා කිහිපයක් ගෙන එන ලදි. රජයේ සියලු ම පාසැල් පරිපාලනය සඳහා පාසැල් කොමිසම නම් මධ්‍ය සංවිධානයක් පිහිටුවීම, ඉංගිරිසි භාෂාව අනිවාර්ය කිරීම, ඉංගිරිසි ඉගැන්වීම සඳහා කොළඹ විද්‍යාලයයක් පිහිටුවීම, ක්‍රිස්තියානි ව්‍යාපාරයට අනුබල දීම කෝල්බෲක් කොමිසම මගින් නිර්දේශ කරන ලද යෝජනා අතර විය.( Mendis, 74- 75) ඉංගිරිසි අධ්‍යාපනය මගින් ස්වදේශීය ජනතාව ශිෂ්ට කළ හැකි බව ද මේ කොමසාරිස්වරුන්ගේ විශ්වාසය විය. විශේෂයෙන් ම ලිපිකාර තනතුරු ඇතුළු සිවිල් සේවයේ ඉහළ තනතුරු සඳහා බ්‍රිතාන්‍ය රජයෙන් ගෙන්වන ලද සේවකයන් සඳහා ඉහළ වියදමක් දරනවා වෙනුවට දේශීය ජනතාවට ඉංගිරිසි අධ්‍යාපනයක් ලබා දීමට සැලැස්වීමත් මේ සඳහා කිසිදු ජාති ආගම් භේදයකින් තොර ව රජයේ උසස් තනතුරු ලබා දීමෙන්

පරිපාලනයට වෙන් කරන ලද මුදල් දීර්ඝ කාලීන වසයෙන් අඩු කර ගත හැකි බව පෙන්වා දුන්නේ ය. ( Silva, 1980:328.) ( කෝල්බෲක්ගේ නව යෝජනා හමුවෙහි සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු කළ පාසැල්හි බිඳ වැටීම සිදු විය. මෙතෙක් උදාසීනකමකින් පවත්වාගෙන ආ පංසල් අධ්‍යාපනය මගින් පමණක් රටේ නැගිගෙන ආ බෞද්ධ පුනර්ජීනවයට හෝ ශාස්ත්‍රෝන්නතියට සෑහෙන පිහිටක් නොලැබෙන බව විශේෂයෙන් නොලැබෙන බව පැවිදි පඩිවරුන් අවබෝධ කරගත් බව පෙනේ. ( රතනසාර හිමි 202)මෙහි ප්‍රතිඵලයක් ලෙස දිස් වනුයේ 1832 වන විට සිංහල පාඨශාලා සියල්ල වසා දැමීමත් ( Mendis 1952:71) ගාල්ල මහනුවර කොළඹ සහ යාපනය යන ප්‍රධාන නගරවල ඉංගිරිසි මාධ්‍ය පාඨශාලා ආරම්භ කිරීමත් ය.( Silva , 1980: 329) ඉංගිරිසි මාධ්‍ය පාසැල් ආරම්භ වීමත් සමග දේශීය ජනතාව තුළ ඒ පිළිබඳව වැඩි උනන්දුවක් ඇති වනුයේ එම මාධ්‍ය හරහා සමාජයේ ඉහළ ස්තරයට නැගීමේ පහසු මාර්ගයක් ලෙස සැලකූ නිසා ය. බ්‍රිතාන්‍යයේ පරිපාලනයේ ඇති වූ ආර්ථික වෙනස්කම් සමඟ ම ලංකා සමාජය තුළ නැගී ආ නව ප්‍රභූ පැලැන්තියට ඉංගිරිසි අධ්‍යාපනයේ අවශ්‍යතාව දැඩි ව දැනිණි. ( Silva, 1980: 332, 333) මෙම තත්ත්වය හමුවෙහි තවත් පසෙකින් ඉංගිරිසින්ට පක්ෂපාති සමාජ ස්තරයක් ගොඩ නැගීම ද දැක ගත හැකි යි. කෝල්බෲක්ගේ යෝජනා ක්‍රියාත්මක වීමත් සමග ම මෙරට දේශීය අධ්‍යාපනය බිඳ වැටීම පැහැදිලිව ම දැක ගත හැකි යි. හුදෙක් දේශීය අධ්‍යාපනය පාලනයට පිටුවහලක් නොවන මුදල් අපතේ යන ව්‍යාපාරයක් ලෙස හේ සැලකුවේ ය. මේ තත්ත්වය හමුවෙහි ඉංග්‍රීසි භාෂා ඥානය සමාජයෙහි ඉහළ ස්තරයක් නියෝජනයක් බව පෙනේ.

ඉංග්‍රීසි භාෂාව ලංකාවේ වරප්‍රසාදලත් පන්තියේ අවියක් සහ උරුමයක් ලෙස සැලකේ. ලංකාවේ පංති විෂමතා බල විෂමතා යනාදිය වැදගත් වන නමුදු සමාජීය වශයෙන් පන්ති පරතරය ජනනය කිරීම සහ පවත්වා ගැනීම අතින් ඉංග්‍රීසියට ඊටත් වඩා වැඩි වැදගත් කමක් දක්නා ලැබේ. ( සිල්වා 2005 98) ඉංග්‍රසි දත් පැලැන්තියට සමාජයෙහි තිබූ තත්ත්වය පහත සඳහන් පද්‍යය මගින් ද තේරුම් ගත හැකි වේ.

ගොසින් උසස් පංතියේ මම ඉන්න කළ සිත වී ලෝ ලා
දනෙන් සපිරුණ මිතුරු මහතෙක් ඇවිත් මා සම්මුඛ වේ ලා
තොසින් ගුඩ් නයිට් කියලා කීවේ පදයක් ගල පා ලා
ඉතින් බැරි බව දැනලා නැගිටුනා එතන ඉංග්‍රීසි වැඩි වේ ලා

බුලත් විටකුත් කාලා සොඳලෙස ඉන්න කළ අයිනට වේ ලා
බඩත් දගලනවාය කියලා කීවේ මිතුරෙක් කොඳුර ලා

( දියස්වන 1894 19 21 24 25 )

17 හා 18වන සියවසේ සමාජ වෙනස්වීම් සමග ඉංග්‍රීසි භාෂාවේ ව්‍යාප්තියත් සමග භාෂාවේ උච්චාරණයෙහි වෙනස්කම් ඇති විය. මෙය පැහැදිලි වශයෙන් ම සමාජයෙහි ඇති වූ වෙනසක් ලෙස ද පෙන්වා දිය හැකි ය. මුදල් බලය තම අතට පත්වන විට පහළ පන්තියෙහි පිරිස ඉහළ පැලැන්තියේ ජනයාගේ උච්චාරණයන් ද අනුගමනය කරන්නට විය. ( Barber, 2000: 42) සන්නිවේදනය කිරීමේ දී යොදා ගන්නා භාෂාව අතිශය වැදගත් වේ. ඊට හේතුව වන්නේ කථාව මගින් ම තන්ගේ භාෂාවේ හා සමාජහි අනන්‍යතාව ඉස්මතු වන හෙයිනි. කථාව හා උච්ඡාරණය වෙනස්වීම යනු කිසියම් ආකාරයක සමාජ විපර්යාශයකට එම සමාජය හසුවීම යැයි පැවසිය හැකි ය. ( John,

1982:3) තත් කාල පරිච්ඡේදයෙහි ඇතැම් ජන කොටස් ප්‍රභූ පැලැන්තිය සේ ජීවත්වීමට අභිරුචියක් දක්වා ඇති අයුරු ද කවි ඇසට යොමු වී ඇත. මේ දෙස උත්ප්‍රාසයෙන් බලන්නට ද ඇතැම් අවස්ථාවල දී පෙළඹී ඇති බව ද දැක ගත හැකියි.

ඇඳගෙන සමහර විලසට සුද්දෝ
දොඩමින් ඉංග්‍රිසි ප්‍රංගි ඇවිද් දෝ
තැන තැන සමහරු විලසට වැද්දෝ
දුටු දන රවටා විද විදූ විද්දෝ

( ගුණසේකර 1894 39)

ක්‍රමයෙන් ඉංග්‍රීසි මාධ්‍යය සමාජය සමාජයෙහි ව්‍යාප්ත වත් ම නව සමාජ ආකල්පයන් ද ගොඩ නැගෙන්නට විය. මේ වූ කලි නව සමාජයකයට අවශ්‍ය ප්‍රවේශය සකස් වීමක් සේ ද හැඳින ගත හැකි වේ.

**පංතිය හමුවේ කුලයේ පැවැත්ම**

සමාජ විද්‍යාත්මක විග්‍රහයන්ට අනුව පැහැදිලි වන්නේ බොහෝ සමාජයන්හි දක්නට ලැබෙන පොදු තත්ත්වය වන්නේ සමාජයෙහි කුලය බිඳ වැටී පංතිය ඉසමතු වන ආකාරය යි. මෙම ස්වභාවය ලාංකේය සමාජ සන්දර්භය තුළ ද එලෙසින් ම ක්‍රියාත්මක වන සිද්ධාන්තයකි. ඉන්දියානු සමාජය තුළ දී කුලය, චාරිත්‍රය හා රැකියාව යන්න එකිනෙකට බැඳී පැවතියත් මූලික වශයෙන් බැඳී පවතින්නේ ආගම සමඟ ය. ( Singh., 1992. 302) Roberts පෙන්වා දෙන ආකාරයට සමාජ ක්‍රියා කාරකම් පළල් වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි බව සඳහන් කරයි.

සමාජික සත්වයකු වන මිනිසා නිරන්තයෙන් ම වෙනස්වීම් අපේක්ෂා කරයි. එසේ වූ කල්හි ඔහු තමාගේ සාම්ප්‍රදායික හර පද්ධතීන් පිළිබඳව එතරම් තැකීමක් අපේක්ෂා නොකරයි. ඇතැම් පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් හා සිතුවිලි තමා ජීවත්වන සමාජය ගමග බැඳී පවතින අතර ම එයින් මිදීමට ද කිසියම් අපහසුවක් ඇති බව පෙනේ. එහෙත් සමාජය තුළ පවත්නා සියලු ම දෑ එකලෙස පිළිගැනීමට ද මිනිසා සැමදා බැඳී නොමැති ය. ( Roberts, 26) තමාට ස්වාධීනව කිසියම් ආකාරයකින් වෙනස්වීමට අවශ්‍ය වුව ද සමාජ බැඳීම් නිසා එලෙස වෙනස්වීමට නොහැකි ය. ( Bheemaiah, 2005: 148) එහෙත් නව කාර්මිකරණයත් සමග යටත් විජිත සමාජයන්හි ජීවන තත්ත්වය ද මිනිසාගේ චින්තනය ද වෙනස් විය. යටත්විජිතකරණයත් සමග නව තාක්ෂණික හා සමාජ සම්ප්‍රදායන් ගොඩ නැගීම මත කුලය වෙනුවට පංතිය ඉස්මතු වීම දැක ගත හැකි යි. (Yechury, 1997. 7) ඉන්දියානු සමාජ ක්‍රමය තුළ නිෂ්පාදිත ක්‍රමවේදය දේපල හා ඉඩම් හිමියන්ට සමාජ ප්‍රභුත්වයක් නිරායාසයෙන් ම ගොඩ නැගෙන්නට විය.( Sengupta, 1979: 24) නමුත් ලංකාවේ දී පංතිය තීරණය කිරීමේ දී තමාගේ වත් පොහොසත්කම පමණක් නොව බ්‍රිතාන්‍ය රජයේ විවිධ තනතුරු නාමාදිය ලැබීම ද පංතිය තීරණය කිරීමේ සාධකයක් වශයෙන් පවතින බව දැක ගත හැකි යි. සමාජය තුළ බලය ක්‍රියාත්මක වීමේ දී වෙළඳ හා ගම්බද ප්‍රභූ පිරිස ක්‍රමයෙන් ධනවත් පංතියක් ලෙස ගොඩ නැගෙන්නට විය. මෙය රටින් රටට වෙනස් ආකාරයකින් ක්‍රියාත්මක වූ සංකල්පයකි. ( Domhoff, 1990. 11) සාම්ප්‍රදායික වශයෙන් තමා උපන් සමාජයෙහි ස්වභාවය මත කුලය තීරණය වීම හා වෙනත් කුල සමග ගණුදෙනු කිරීමේ සීමාවන පැවතිය ද එම තත්ත්වය සැමකල්හි ම පැවතිය නොහැකි ය. ( Kethar, 1979 . 15 ) Michel, Roberts පෙන්වා දෙන ආකාරයට

සමාජ ප්‍රවේශය ලබා ගන්නා විට කුලය යන්න ක්‍රමයෙන් වටිනා කමක් නැති සාධයක් ලෙස ගොඩ නැගුණු බව පෙන්වා දෙයි. ( Roberts, 1973: 338) සාම්ප්‍රදායික සමාජය තීන්දු කිරිමේ දී ධනය කුලය හා රැකියාව ප්‍රධාන කාරණා බවට පත් වුව ද අධ්‍යාපනය සැමට ලැබීම කුල පදනම දෙදෙරා යෑම සඳහා ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇති බව පෙනේ.( Singh, 1992: 138) සැමට අධ්‍යාපනය ලැබීමේ වරප්‍රසාදය හිමි වීම කුල පදනම බිද වැටීමට ප්‍රධාන සාධයක් වශයෙන් පවතිව බව බොහෝ දෙනාගේ මත බව තවදුරටත් දැක හැකි වේ. ( Samarasinha , 1998: 50) නීරා වික්‍රමසිංහ පෙන්වා දෙන පරිදි ලංකාවේ දී නූතන සමාජ ප්‍රවේශය ලබා ගන්නා විට කුලය යන්න ක්‍රමයෙන් වටිනා කමක් නැති සාධයක් ලෙස ගොඩ නැගුණු බව පෙන්වා දෙයි. කුල පදනම මූලික වශයෙන් ම නව අධ්‍යාපන ක්‍රමය මගින් බිද වැටීමකට ලක් වී ඇත. යටත් විජිත සමාජයන්හි ගොඩනැගිලි නඩත්තු කිරීම මහා මාර්ග හා දුම්රිය මාර්ග ඇතිකිරීම වරායවල් ඇතිකිරීම සඳහා නවතාක්ෂණික ඥානයෙන් යුත් මිනිසුන් බිහි කිරීමේ අවශ්‍යතාව බ්‍රිතාන්‍ය පාලකයන්ට දැනිණි. මේ හේතුවෙන් සාම්ප්‍රදායික අධ්‍යාපනය ක්‍රමය නොසලකා නව අධ්‍යාපන ක්‍රම හඳුන්වා දීමට යටත් විජිත වාදීහු උත්සහා කළහ. ( Kaul, 1993: 23) බුදු දහමෙන් නව වටිනාකම් සමාජයට ඉදිරිපත් කළ ද සාම්ප්‍රදායික සමාජ රටාවන් එලෙසින් ම පැවතිණි. නමුත් මානව විද්‍යාත්මක දෘෂ්ටියෙන් මේ පිළිබඳව අපක්ෂපාතිව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ නව සංස්කෘතික හර පද්ධතීන් යටත් විජිත සමාජ තුළ ඇති කිරීම ශ්‍රී ලාංකේය සමාජ ක්‍රමය වෙනස්වීම කෙරෙහි ප්‍රබල අන්දමින් ම බල පෑ බවකි. විශේෂයෙන් ම විදේශීය බලය තාක්ෂණය ව්‍යාපාර හා වාරි කර්මාන්තය යනාදිය ලංකා සමාජය තුළ ස්ථාපිත වීම හේතුවෙන් සමාජ වටිනාකම් පිළිබඳව ප්‍රශ්න මතුකිරීම් ඇති විය. මේ හේතුවෙන් නව බුද්ධිමය ප්‍රවහායක් සමාජය තුළ ව්‍යාප්ත වීම විය. ( Senavirathna, 1999: 5) එසේ වුවත් නූතන සමාජ ක්‍රමය තුළ වුව ද තවමත් සාම්ප්‍රදායික වශයෙන් මසුන් මැරිම හා රෙදි සේදීම වැනි ක්‍රියා තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. එසේ ම විවහා කටයුතුවලදී මෙන් ම විශේෂයෙන් ම දේශපානයයේ දී ද විශේෂයෙන් ම කුලය බල පවත්වන බව දැක ගත හැකි යි. ( Wickramasinha, 42) එහෙත් කුල ක්‍රමයේ පැවැත් ම පිළිබඳව මෙහි දී විමසීමක් සිදු නොකරේ. එය මීට අදාළ නොවන හේතුවෙනි.

## නිගමනය

බුදු දහමෙන් නව වටිනාකම් සමාජයට ඉදිරිපත් කළ ද සාම්ප්‍රදායික සමාජ රටාවන් එලෙසින් ම පැවතිණි. නමුත් මානව විද්‍යාත්මක දෘෂ්ටියෙන් මේ පිළිබඳව අපක්ෂපාතිව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ සංස්කෘතික වශයෙන් කිසියම් බලපෑමක් සිදු වුවද සමාජ ක්‍රමය වෙනස්වීම මත සාම්ප්‍රදායික මතවාදයන්හි එල්බ සිටි ජනයාහට තම කුල ක්‍රමය ආරක්ෂා කර ගැනීම සඳහා අරගලයක නිරත වන්නට විය. මුද්‍රණ ශිල්පය ඇතිවීම මගින් මිනිසාගේ ප්‍රකාශන ශක්තියේ නිදහස උදා වු අතර ම එතෙක් සාම්ප්‍රදායික වශයෙන් මතවදායන්හි සිර වී සිටි ජනයා හට තම අදහස් නිදහස් ලෙස ප්‍රකාශ කිරීමට අවස්ථාව උදාවීම යටත් විජිත සමාජයෙහි තාක්ෂණික ඥානයෙහි ප්‍රතිඵලයක් ලෙස ම හඳුනා ගත හැකි වේ. තත් අවධියේ දී කුලය ප්‍රබල සමාජ සංස්ථාවක් ලෙස පැවතීම හේතුවෙන් ම ඒ පිළිබඳව කවීන්ගේ අවධානය යොමු වීමට හේතු වී ඇතැයි නිගමනය කල හැකිය. විවිධ මත විමර්ශනයේ දී පැහැදිලි වන්නේ නූතන සමාජ ක්‍රමය විවෘත වීම තුළ සාම්ප්‍රදායික දෘෂ්ටිය වෙනස්වී භෞතික කාරණා මත තම සමාජ තත්ත්වය තීරණය සාධකයක් ලෙස ගොඩ නැගී ඇති බව යි. මුදල් ඇති සමාජය , නව නිවාස , ඉංග්‍රීසි භාෂාවේ ආධිපත්‍යය පැතිරීම හා නව ප්‍රභු පංතියේ නැගීම මත කුල සංස්ථාවට තවදුරටත් ස්වාධීන ලක්ෂණ

ආරක්ෂා කර ගැනීමින් පැවතිය නොහැකි ය . මෙම සමාජ ක්‍රමය තුළ කුලය නොව විෂය මූලික වශයෙන් වැදගත් වන පංතිය වඩාත් හොඳින් ඉස්මතු වන බව ද දැක ගත හැකි යි.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


අප්පුහාමි වී. කරෝලිස්, ( 1893) කුපාඩි හටන හෙවත් ස්ත්‍රී වලිප්පුව,කොළඹ.

ආරියපාල ල ඇම්. බී.( 1962), මධ්‍යකාලීන ලංකා සමාජය, කොළඹ : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය මගින් පළකරන ලදී.

ඇඳගම, මාලනි ( 1991) . ''බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වර්ධනයේ පදනම 1796 සිට 1832 දක්වා'' සංස්: ජී.පී.වී සෝමරත්න ( සංස්) ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය,කොළඹල විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ ප්‍රකාශනයකි.

ඉතිහාස වර්ණාව හෙවත් කෙවට්ට වංශයේ අසම්පූර්ණකමත් ඉතිහාසයේ සම්පූර්ණකමත් පෙන්වා දීම යි. ( 1879), කොළඹ : (ජෝන් ප්‍රනාන්දු වීරවණ්ණ කුරුකුලසූරිය අප්පුහාමි විසින් කොළඹ පිටකොටුවේ දෙවෙනි හරස්වීදියේ කතෝලික මුද්‍රණ ශාලාවෙහි අච්චුගස්වන ලදී. ( 14165 - 1-3 ජ 4 ල ' බ්‍රිතාන්‍ය පුස්තකාලය )

ඒ. ඩබ්. ජී (1895), දුම්රිය මාර්ග විස්තරයකරුණාරත්නල ඇප් .ඩබ්ලිව්. ඇම්.( 1891). අඩගනෝපදේශය හෙවත් භාර්යාවන් දෙවර්ගය හා හොඳ භාර්යාවන් වන ක්‍රමය, ජෝන් පොන්සෙකා සහ සමාගම

කුමාරස්වාමිල ආනන්ද . ( 1958) මධ්‍යකාලීන සිංහල කලා, කොළඹ.

කුරුකුලරත්න දොන් අන්දිරිස්ල ( 1895) ගන්දර අදානියෙල් ප්‍රලාපකතුර හෙවත් සගබත්විභාගේල මාතර සිරිධර ප්‍රෙස්

ගුණසේකරල ඒ. ඩබ්ලිව්. ( 1894), කව්මිණි දපන හෙවත් දෙවිනුවර විෂ්ණු දේවපූජා පෙළහැර වර්ණනාව,සිරිධර ප්‍රෙස්.

තිලකසිරිල සිරිග ( 1998), ( සංස්) ගංගාරෝහණ වර්ණාව, මරදාන රත්න පොත් ප්‍රකාශකයෝ.

*දුස්සීලවත හෙවත් දුස්සීලයන් හැඳිනගැනීමේ ලකුණු ( 1887),* කොළඹ පදිංචි ජේ. පෙරේරා විසින් ලක්මිණි පහන් යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරන ලදී.

පීරිස් රල්ෆ්ල ( 2001) සිංහල සමාජ සංවිධානය ( මහනුවර යුගය) බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ පෙරේරා, කේ. ආර් ( 1893). සුදු හටනය සහ කොතලාවල ඉන්ස්පැක්ටර්තුමා ගැණ වර්ණනාව, විද්‍යාසාගර යන්ත්‍ර ශාලාවේ අච්චු ගස්සන ලදී.

පෙරේරා, නිහාල් ( 2004), 19 වන සියවසේ අග භාගයේ කොළඹ සහ එහි භූමි දර්ශනයී ලසංසක පෙරේරා ( සංස් ) පයිත